# රණවිරුවා

2020 පෙබරවාරි • 214 කලාපය



## ආදරණීය දිනයක ආදරණීය හමුවක්



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.






# ආදරවන්තයින්ගේ දිනයට අර්ථවත් හමුවක්



යුද්ධ හමුදාධිපතිතුමා රණවිරුවන් පිනවීම සඳහා ගීතයක් ගායනා කරමින්.



අත්තිඩියේ පිහිටි මිහිඳුසෙත් මැදුරේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයිනගේ සහභාගීත්වයෙන් සුහද හමුවක් පසුගියදා පැවැත්විණ. 2020 පෙබරවාරි 14 දිනට යෙදුණු ආදරවන්තයින්ගේ දිනය නිමිත්තෙන් සංවිධානය කෙරුණු එම අර්ථවත් අවස්ථාවට වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය සහභාගි වූහ.

දශක තුනක යුද්ධය හමුවේ සිය ශරීර අවයව දන්දී රට වෙනුවෙන් කැපවූ එම වීරෝදාර රණවිරුවන් සමඟ යුද්ධ හමුදාධිපතිතුමන් එහිදී යුදබිමේ මතක ආවර්ජනය කරන්නටද අමතක නොකළේය. රණක්ෂිතයට පත් රණවිරුවන් 50 දෙනෙකු ඔවුන්ගේ භාර්යාවන් හා දරුවන් සමඟ එක්වූ එම ආදරණීය හමුවේදී ඔවුන් වෙත ත්‍යාග පිරිනැමීමටද කටයුතු යෙදිණ. එහිදී එම විරුවන්ගේ නර්තන හා ගායන හැකියාවන්ගෙන් උත්සවය තව තවත් වර්ණවත් වූහ.

# සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණු අභ්‍යාසයක්...







"අප විශ්වාසය තැබිය යුත්තේ සතුරා නොපැමිණීමේ සම්භාවිතාව මත නොව, ඔහුට මුණගැසීමට ඇති අපගේම මුදානම මතය. මේ අනුව නැගී එන අභියෝග හඳුනා ගැනීම කාලෝචිත අවශ්‍යතාවයක් වන අතර, ඒවා ඵලදායි හා කාර්යක්ෂමව විසඳීමට අත්‍යවශ්‍ය හැකියාවන්ගෙන් සන්නද්ධ විය යුතුය. මෙම සන්දර්භය තුළ සයිබර් අවකාශය සහ යුද්ධ හමුදා සාමාජිකයින් අතර එහි ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා මෙවැනි වැඩසටහන් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ" වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉහත අදහස් දක්වන ලද්දේ 2020 ජනවාරි 30 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවති සයිබර් ආරක්ෂාව පිළිබඳ පැවති පුහුණු අභ්‍යාසයේදීය.

ප්‍රධාන සංඥා නිලධාරී මෙන්ම සංඥා බළකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සීගේ මූලිකත්වය ඇතිව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ සහ එහි නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන්ගේ සහය ඇතිව පවත්වන ලද මෙම සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණු අභ්‍යාසය මගින් ප්‍රතිවිරෝධී ශිල්පීය ක්‍රම, සයිබර් ආරක්ෂණ අරමුණ, අයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අලුත් ක්‍රමවේදයන් එළිදැක්විණ.



# කොරෝනා වෛරසය නිරෝධායනය කළ සැමට පැසසුම්....





මාරාන්තික කොරෝනා වෛරසය චීනයේ සීඝ්‍රයෙන් පැතිරයාමත් සමඟ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ උපදෙස් මත ආරක්ෂක අමාත්‍යංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යංශයේ කාලෝචිත මැදිහත්වීමෙන් චීනයේ රැඳී සිටි ශ්‍රී ලාංකිකයින් මෙරටට ගෙනවිත් නිරෝධායනය කිරීමේ ජාතික ව්‍යාපෘතියක් දියත් කරන ලදී. ඒ සඳහා දායක වූ 150 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් 2020 පෙබරවාරි 14 දින යුද්ධ හමුදා මූලස්ථානයට කැඳවන ලදී. එහිදී ඔවුන් විසින් සිදුකළ එම විශිෂ්ට කාර්යය වෙනුවෙන් වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් සිය ප්‍රශංසාව පුදකළේය.

**“ලොව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කොරෝනා වසංගත වෛරසය නිසා මුළු මහත් ලෝකයාම භීතියට පත්ව ඇති බවත් මෙම භයානක වෛරසය චීනයේ වුහාන් නගරයෙන් ව්‍යාප්ත වූ බවත් අපි දනිමු. අන්තරාදායක, අසීරු අවස්ථාවක රටේ නායකයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලාංකිකයින් බේරාගැනීම සඳහා ආසියානු කලාපයේ අන්කිසිදු රටක් නොගත් ක්‍රියාපිලිවෙතක් නිර්භයව අනුගමනය කළ බව ප්‍රථමයෙන් සිහිපත් කළ යුතුය. මෙය ජාතියක් වශයෙන් අපට ආඩම්බර විය යුතු කරුණක් වන අතර, ඉන් පසුව රජය අනුගමනය කළ නිර්භීත හා නිවැරදි තීරණයද එසේමය”**





# රුසියානු ජනරජ භූමි ප්‍රධානී යුද්ධ හමුදාධිපතිතුමන් හමුවේ

වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවට සපැමිණි රුසියානු ජනරජ භූමි මෙහෙයුම් ප්‍රධානි ජෙනරාල් ඔලෙග් සැලියුකෝව් (Oleg Salykov) 2020 පෙබරවාරි 03 දින යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයකට එක්විය. එහිදී එම නියෝජිත පිරිස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ගෞරවාන්විත ලෙස පිළිගන්නා ලදී.



යුද්ධ හමුදා මූලස්ථානයෙහි සංචාරය මතකයට එක් කිරීමේ අරමුණින් එතුමන් යුද්ධ හමුදා මූලස්ථානයේ සියලු ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් සමඟ සමූහ ඡායාරූපයකට ද පෙනීසිටි අතර, එය තරු 5 කින් සමන්විත විදේශ ජෙනරාල්වරයකු සමඟ සමූහ ඡායාරූපයක් ගත් ප්‍රථම අවස්ථාව වීම විශේෂත්වයකි.





# සැම්බියන් යුද්ධ හමුදාධිපති උණුසුම් අයුරින් පිළිගනී....





සැම්බියානු ජනරජයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ඩබ්ලිව්. එම්. සිකාස්වේ පීඑස්සී ඩීඅයිපී (ඩීඑස්එස්) එම්ඒ (ඩීඑස්එස්) (Lieutenant General W.M. Sikazwe psc DIP (DSS) MA (DSS) ශ්‍රී ලංකාවේ සිදුකළ පස්දින නිල සංචාරය අතරතුර 2020 පෙබරවාරි 24 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ සැම්බියන් යුද්ධ හමුදාව අතර පවත්නා ද්විපාර්ශ්වික සුහදත්වය, සම්බන්ධතාවය සහ අවබෝධය තවදුරටත් ශක්තිමත් කිරීම මෙහි අරමුණයි.

## තවත් ආබාධිත රණවිරුවන් පිරිසක් "දඹදිව" වන්දනාවක...






ත්‍රස්තවාදීන්ට එරෙහිව සිදුකළ මෙහෙයුම්වලදී ආබාධිත වූ තවත් රණවිරුවන් 15 දෙනෙකු සහ ඔවුන්ගේ භාරකරුවන් 5 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් යුද හමුදාවේ මැදිහත්වීම මත දඹදිව වන්දනා සංචාරයක රැගෙන යාම සඳහා සූදානම් කර ඇත. වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් මත පුරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් 2020 පෙබරවාරි 20 දින උදෑසන ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ පැවැති කෙටි උත්සවයකදී යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් රණක්ෂිතයට පත් එම රණවිරුවන් වෙත නොමිලේ ගුවන් ටිකට්පත් සමඟ මූල්‍යමය ප්‍රදානයක්ද සිදුකරන ලදී. මීට වසර කිහිපයකට ප්‍රථම යුද්ධ හමුදාධිපතිතුමන් යුද්ධ හමුදා විධායක ජෙනරාල් ලෙස කටයුතු කරමින් සිටි සමයේදී ආරම්භ කරන ලද වන්දනා ව්‍යාපෘතියේ 4 වන අදියර ලෙස මෙම වන්දනා ගමන සිදුකරනු ලබයි. "මිහිඳු සෙත් මැදුර", "රණවිරු සෙවණ-රාගම"සහ "අභිමංසල-1,2,3" යන සුවතා නිකේතනයන්හි ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන් ඒ සඳහා සහභාගී විය.

විවිධ හැකියාවන් ඇති ජීවිතාන්තය දක්වා රෝද පුටුවක ආධාරයෙන් ජීවත් වන මෙම වීරෝදාර රණවිරුවන් වෙනුවෙන් ගුවන් ගමන් බලපත්‍ර හා අවශ්‍ය අනෙකුත් පහසුකම් පිරිවැය යුද්ධ හමුදාව විසින් දරනු ලබයි. මෙම උත්සවය සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික, යුද සේවා ලේකම්, පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ, පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී වූහ.

## ලෝකයේ පළමු පරිසර හිතකාමී රෝග නිවාරණ රෝහල....

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය තාක්ෂණික විශේෂඥතාව සහ ශ්‍රමදායකත්වය යොදා ගනිමින් ලොව ප්‍රථම පරිසර හිතකාමී රෝග නිවාරණ රෝහල අනුරාධපුරයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. රුපියල් මිලියන 120 ක් ඇස්තමේන්තු ගතකර ඇති මෙම සුවිශේෂී ව්‍යාපෘතියේ මූල්‍ය පිරිවැය "ශාන්ති පදනම" විසින් ලබාදීමට නියමිතය. වර්ෂ 2017 දී ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශාන්ති පදනම අතර අත්සන් තැබූ අවබෝධතා ගිවිසුමක් මත අම්බතලගම ප්‍රදේශයේ අක්කර 3.1 ක භූමි ප්‍රමාණයක් මෙම රෝහල ඉදිකිරීම සඳහා වෙන්කෙරේ. ඉදිකිරීමට යෝජිත රෝහලේ රෝගීන් 40 දෙනෙකුට නේවාසිකව ප්‍රතිකාර ලබාගැනීම සඳහා පහසුකම් සලසා ඇත.



ඒ අනුව මිහින්තලේ, අම්බතලගම ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත එම නිවාරණ රෝහල සඳහා මුල්ගල තැබීමේ උත්සවය 2020 පෙබරවාරි 22 දින උදෑසන සුබ මොහොතින් සිදුකෙරිණ. මෙම අවස්ථාවට සෞඛ්‍ය අමාත්‍යවරිය නියෝජනය කරමින් පරිසර හා වනජීවී සම්පත් අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන, වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ ඕස්ට්‍රේලියානු ශාන්ති පදනමේ සභාපති ආචාර්ය සුහර්ෂා කාන්තිගොඩ මහත්මිය එක්වූහ.



## උණුසුම් සුබ පැතුම් මැද ඓතිහාසික හමුවක්...



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 20 දෙනෙකු 2020 පෙබරවාරි 12 දින වැඩ බලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ. වැඩිම පිරිසක් එකවර මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව එය වූ අතර එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සිය උණුසුම් සුබ පැතුම් එක්කළේය. එම අවස්ථාවට තවත් වටිනාකමක් එකතු කරමින් යුද්ධ හමුදාධිපතිතුමා විසින් රිදී ආලේපිත අසිපතක අනුරුව බැගින් එම උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට පිරිනැමීමට ද කටයුතු කරන ලදී. එසේම පළමුවරට විශේෂිතව නිර්මාණිත කප්ලින්ස් (Couplings) යුගල බැගින්ද නව මේජර් ජෙනරාල්වරුන් වෙත ලබාදීමද විශේෂත්වයකි.

## ඓතිහාසික මොහොතක සුභාශිංශසන...




වැඩබලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය පෙබරවාරි 12 දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී මෑතකදී උසස්වීම් ලැබූ නිලධාරීන් 244 දෙනෙකු අම සිය සුභාශිංශන පිරිනැමීය.

72 වන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් සන්නද්ධ හමුදා සේනාවිධායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමන් විසින් මෙම උසස්වීම් පිරිනමන ලද්දේ බ්‍රිගෙ'ඩියර්වරු 17 දෙනෙකු මේජර් ජෙනරාල් නිලයට, ලුතිනන් කර්නල්වරු 45 දෙනෙකු කර්නල් නිලයට, මේජර්වරුන් 49 ක් ලුතිතන් කර්නල් නිලයට, කපිතන්වරු 42 දෙනෙක් මේජර් නිලයට, ලුතිනන්වරු 80 දෙනෙක් කපිතන් නිලයට සහ දෙවන ලුතිනන්වරු 11 දෙනෙක් ලුතිතන් නිලයට යනාදී වශයෙනි. යුද්ධ හමුදාධිපතුමාගේ පුද්ගලික මැදිහත්වීම මත මෙම උසස්වීම් පිරිනැමුනු අතර, මෑත ඉතිහාසයේ එක්වරකදී උසස්වීම් ලැබූ වැඩිම හමුදා නිලධාරීන් පිරිස ඔවුන් වීම ද විශේෂත්වයකි.






# යතුරුපැදි ධාවකයින්ට දිරියක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් බිහිවූ දක්‍ෂතම යතුරුපැදි ධාවකයින් දෙදෙනෙකු වන 1 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ කෝප්‍රල් ප්‍රේමරත්න එච්එම් සහ 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සාමාන්‍ය සෙබළ රාජකරුණා එස්ජ් වෙත 2020 පෙබරවාරි 20 දින යමහා (YAMAHA) වර්ගයේ නවීන යතුරු පැදි දෙකක් ප්‍රදානය කරනු ලැබීය.



එම ක්‍රීඩකයින් ජාතික මට්ටමින් දැක්වූ ජයග්‍රහණ පැසසුමට ලක්කරමින් වැඩ බලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් මෙම ප්‍රදානය සිදුකරන ලද්දේ ඔවුන් තවදුරටත් දිරිමත් කරමිනි.

රුපියල් මිලියන 2.5 ක පමණ වටිනාකමින් යුත් මෙම නවීන ධාවන පැදි 02 පරිත්‍යාග කළ යුද්ධ හමුදාධිපති ඔවුන්ගේ අනාගත ජයග්‍රහණ උදෙසා සිය සුබ පැතුම් ද එක් කළේය. මෙම උත්සවය සඳහා යුද්ධ හමුදා මොටර් රථ ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් අයිඕ මාදොල ද එක්විය.

---

# පරාර්ථකාමී විරුවන්ගේ උත්තම මෙහෙවරට පැසසුම්...



චීනයෙහි කොවිඩ් වෛරසය ආසාදිත ප්‍රදේශයෙහි අධ්‍යාපන කටයුතු කරමින් සිට රෝගයට ගොදුරු වී ඇතැයි සැක සහිතව මෙරටට රැගෙන ආ පිරිස වෙනුවෙන් යුද්ධ හමුදාවේ ශ්‍රම හා තාක්‍ෂණික දායකත්වයෙන් දියතලාව යුද්ධ හමුදා කඳවුරේ අතිනවීන නිරෝධායන වාට්ටු සංකීර්ණයක් ඉදිකරන ලදී. වැඩබලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා සෘජු මැදිහත්වීම මත එම රෝහල ඉදිකිරීමට දායක වූ යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය 2020 පෙබරවාරි 13 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපතිතුමන්ගේ ඇගයුමට බඳුන්විය. එහිදී රෝහල් ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට දායක වූ දියතලාව රෝහල් පරිශ්‍රයේ පරිපාලකයින්, තාක්‍ෂණික විශේෂඥයින් සහ 17 ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, ප්‍රගුණ හා සැඟවුනු වෙඩික්කරු පුහුණු පාසල, ස්වේච්ඡා බලකා පුහුණු පාසල සහ යුද්ධ හමුදා රෝහලේ නිලධාරීන් සහ යුද්ධ හමුදා සාමාජිකයින් ඊට එක්වූහ.



# සිතුවිලි සාගරය

## ආදරෙයි මං නුඹට...

නුඹ හිමි නෑ මට...දන්නව මම...
මොනව කරන්නද...ඒත්...
හිත කියන්නෙම නෑ මට...
නුඹ දුරයි කියා...
ලඟින් ඉන්නට වරම් නැතත්...
ඈතින් හිඳ නුඹ දෙස බලා...
සැනසෙන්නට මට...
ඉඩක් දෙන්න ඔයා...
අහුරන්න එපා මංපෙත්...
නිදහසේ ගලායන ආදරයට...
නුඹ වෙනුවෙන් මසිත තුළ...
නුඹ දැනගත්තත් නැතත්...
නුඹ හිමි වුනත් නොවුනත්...
ආදරෙයි මට හැමදාම නුඹට...
නුඹේ හදවතට...

සෙ/650888
බනි 11 වීරකෝන් පීඑම්ජී
වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

## මියගිය මිතුරා..

සදාදර සොයුරාණෙනී...
රූපයටම රත්නයක් වූ
ඔබ ගුණ සමුදාය...
නිමක් නැති සයුර පරදවයි
අනුපමේය මෙහෙවරක් කළ
ඔබ අපෙන් සමුගත්තේය
ඇයි ද කියා හරිම ශෝචනීයයි
එදා අතීතයේ යුද වැදුණු
වීර සෙබලෙකු මෙන් ඔබද
උරදුන් ඔබ අපි දන්නෙමු
ඔබ අපට සදා අමරණීයයි
ඉතින්... ඔබ වන්
සොහොයුරෙකු අපට
අහිමිවූ දුක කියා
නිමකළ නොහැක...
මතු උපදින හැම භවයකම
අපට හමුවේවා...
කිසි දිනෙක අකල් මරණයකට
ගොදුරු නොවේවා...

එල් ජයසුන්දර මැණිකේ
ප්‍රාදේශීය සිවිල් පරිපාලන කාර්යාලය
මින්නේරිය

## රණවිරු බිරිඳක්..

ගතින් ඔබ මා ලග නැතත්
සිතින් සැමදා මා ඔබ ලඟයි
ගෙවෙන හැම මොහොතක් පාසා
සිත ඔබ ගැන විමසයි
මතකය අමතක කරලන්නට හැදුවත්
හැමවිට ඔබ ගැන මතකයට එයි
දරු පාටවුන් නිතරම
නුඹ ගැනම සොයයි
පිය සෙනෙහසක අරුමය
මා ඔවුන්ට කියමි
තල් වැට මායිමට වී
ගිනි අවිය තුරුලු කරන්
මුළු රටම ගැන සිතන ඔබ
නොරහස
ඔබගේ සතුට වෙනුවෙන්
මා සැමදා නොඅඬා ඉන්නෙමි
මගෙ සිත හැදුවෙමි
ඔබ රට රකින බව කියා

සෙ/7ජී02328
ලා/කෝ බංඩාර ඩීඑම්ආර්
යුද්ධ හමුදා කඳවුර
කොඩිකාමම්

## ජීවිතය...

හිමිවුන දේට වඩා
අහිමිවූ දෑ අපමණය
මේ ජීවිතයේ...
සතුටට වඩා දුක
විටෙක සැනසෙමි
ඒ දෛවය යැයි සිතා
විටක අධිටන් කරගනිමි
ජීවිතයේ හමුවන බාදකයන්ට
මුහුණදී ජීවිතය ජයගන්න...
සත්තයි
උත්සාහය අධිෂ්ඨානය ඇත්නම්
සැමවිට
එය නියතයි නිසැකවම...

සෙ/කියු104364
සාසෙ බංඩාර කේඑම්ජීඑච්
යුද්ධ හමුදා කඳවුර
සුගන්ධිපුරම්
මුලතිව්

## නුඹ...

නෙත් කොනින් බලා...
හිනැහෙන්නී...
මෘදු මොලොක්
වචන තෙපලන්නී...
අන් සතු මලක්
නොවෙද නුඹ...
දැන දැනත් අහිමි වන
බව කරනු එපා ආලය...
ප්‍රේමය මුලාවකි...

සෙ/2එල්00815
කෝප්‍රල් චතුර කුමාර පීජීඑන්
2(සෙව්) ශ්‍රීලයුවෙබ
යුහ ජනපදය
පනාගොඩ



## අහිමි ආදරය...

සිත දවන නෙතු තැවෙන
සුසුම් ගී අවුලුවන
ළඟ ලැගුම් ගෙන
බෝ දුරට පාව යන
අහිමිවග දැන දැනම
මම හුගක් පෙම්කරන බව
දන්නවද නුඹ ඒක...

සෙ/ඊ100461
කෝප්‍රල් රත්නායක එල්පීසීබී
3 වන සිංහ රෙජිමේන්තුව
නුවරඑළිය

# ස්වර්ණමාලී ථූපාභිවන්දනාව...







පූජනීය රුවන්වැලි මහා සෑයේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම නිකාය ආරම්භ කොට 70 වසරක් සපිරීම නිමිත්තෙන් 2020 පෙබරවාරි 15 දින සන්ධ්‍යාවේ "ස්වර්ණමාලී තූපාභිවන්දනා" අතිඋතුම් පිංකම අනුරාධපුර රුවන්වැලි සෑ පුදබිමේදී පැවැත්විණ. වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැති එම පිංකමට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මියද සහභාගී වූහ.

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම නිකායේ ප්‍රධාන ලේකම් සහ කහාව ගල්දූව වන ආරාමයේ ප්‍රධාන සංඝනායක ත්‍රිපිටක විශාරද අතිගරු පූජ්‍ය කහගොල්ලේ සෝමවංශ නායක හිමිපාණන්ගේ අනුග්‍රාහකත්වයෙන් පැවැති මෙම රාත්‍රී පිංකමේ ආසන ශාලා සකස් කිරීම, බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ගිලන්පස පූජා කිරීම සහ බැතිමතුන්ට ආහාරපාන ලබාදීම, "පෙරහැරක්" පැවැත්වීම සහ අනෙකුත් පහසුකම් සැලසීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් මත ගජබා රෙජිමේන්තු මූලස්ථානයේ යුද්ධ හමුදා සාමාජිකයින් 300 කට අධික පිරිසක් සිය පූර්ණ සහයෝගය ලබාදෙනු ලැබීය.

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම නිකායේ නව භික්ෂූන් වහන්සේලාට "අක්තපත්‍ර" පිරිනැමීම, පූජනීය රුවන්වැලි මහා සෑයට " අටපිරිකර" 50000 ක් පූජා කිරීම, උඩරට හා පහතරට මල්, කප්රුක්, "ගිලන්පස" සහ සුවඳ දුම් පූජා කිරීම, ගුවනින් මල් දැමීම, චෛත්‍ය හා ජයශ්‍රී මහා බෝ සමිඳු පරිශ්‍රය ආවරණය වන පරිදි පහන් දැන්වීම එම පූජනීය මෙහෙවරෙහි විශේෂ අවස්ථා විය.

# තුර්කියේ නව තානාපති යුද්ධ හමුදාධිපති හමුවෙයි...



ශ්‍රී ලංකාවේ තුර්කි තානාපති කාර්යාලයේ නව තානාපති ආර් ඩනේට් සෙකර්සියොග්ලු 2020 පෙබරවාරි 26 දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථායේදී වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

එහිදී යුද්ධ හමුදාධිපති විසින් තුර්කි තානාපතිනිය වෙත දෙරටේ පරම්පරා ගණනාවක් තිස්සේ පවත්වාගෙන ආ මිත්‍රත්වය තවදුරටත් පවත්වා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් සුහද පිළිසඳරක නිරත විය.

# කොරෝනාවට එරෙහි මෙහෙයුම් සඳහා යුද්ධ හමුදාවට සහය...

මාරාන්තික කොරෝනා වෛරසය (Covid-19) චීනයේ සීඝ්‍රයෙන් පැතිරයාමත් සමඟ ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් මත ආරක්ෂක අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාලෝචිත මැදිහත්වීමෙන් එරට රැඳී සිටි ශ්‍රී ලාංකිකයින් මෙරටට ගෙනවිත් නිරෝධායන කිරීමේ ක්‍රියාවලිය සිදුකරන ලදී. ඒ පිළිබඳ පැහැදීමට පත් " ඇනසල් ලංකා පුද්ගලික සමාගම" විසින් හදිසි අවස්ථාවකදී භාවිත කිරීම සඳහා සකසන ලද නවීනතම ආරක්ෂිත ආවරණ කට්ටල 25 ක් වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හට 2020 ජනවාරි 20 දින යුද්ධ හමුදා මූලස්ථානයේ පිහිටි සිය කාර්යාලයේදී ප්‍රදානය කරන ලදී.

ලිතුවේනියාවේ නිෂ්පාදිත මෙම ආවරණ කට්ටලයන්හි සම්පූර්ණ වටිනාකම ඇමරිකානු ඩොලර් 5000 ක් පමණ වන අතර, එම ආවරණ කට්ටල බැක්ටීරියා ආසාදන, රසායනික ප්‍රතික්‍රියා, වෛරස් ආසාදන ආදී ආසාදන අවධානමින් තොරය. මෙම පරිත්‍යාගය යුද්ධ හමුදා මූලස්ථානයේ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සිසිර පිලපිටිය විසින් සම්බන්ධීකරණය කරන ලදී. මෙම ආවරණ කට්ටල නැවත භාවිතය සඳහා සුදුසු ආකාරයෙන් නිර්මාණය කර ඇති අතර බටහිර අප්‍රිකාවෙහි ඇතිවූ ඉබෝලා වෛරසය පැතිරීම වැලැක්වීම සඳහා මෙම ආවරණ ඉතා කාර්යක්ෂම ලෙස භාවිත කොට තිබේ. මෙම සමාගම විසින් තවත් මෙවැනි ආවරණ කට්ටල 25 ක ප්‍රමාණයක් මුල්ලේරියාවේ පිහිටි අයි.ඩී.එච්. රෝහල වෙතද මීට ප්‍රථම ප්‍රදානය කොට ඇත.





# CISM මාර්ග ධාවනය මෙවරත්...





ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, නාවික සහ ගුවන් හමුදාධිපතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් වූ "CISM මාර්ග ධාවනය" 2020 පෙබරවාරි 18 දින උදෑසන කොළඹ දී පැවැත්විණ. ලොවපුරා ක්‍රියාත්මක CISM මාර්ග ධාවනයට සමගාමීව අන්තර්ජාතික හමුදා ක්‍රීඩා කවුන්සලය විසින් ලබාදී ඇති මාර්ගෝපදේශනයට අනුව පැවැත්වූ මෙම පා ගමනට ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 250 කට අධික පිරිසක් සහභාගි වූහ.

ක්‍රීඩාවෙහි යෙදීම ප්‍රචලිත කිරීම හා හමුදා සංදර්භය තුළ ක්‍රීඩාව මගින් සියලු ජනකොටස් තුළ සමගිය ඇතිකිරීම අරමුණු කරගනිමින් වාර්ෂිකව පැවැත්වෙන මෙම වැඩසටහන CISM මාර්ග ධාවනය ලෙස 2006 වර්ෂයේදී ආරම්භ කර තිබිණ. එදින සිට මෙම "CISM" ධාවනය සෑම වර්ෂයකම ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ සංවිධාන ශක්තියෙන් යුතුව පැවැත්වෙන අතර, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මෙම වසරේදී එය සංවිධානය කරන ලදී. එම ධාවනය සඳහා ආබාධිත විරුවන් කිහිපදෙනෙකු රෝද පුටු මතින් සහභාගීවීම ද විශේෂත්වයකි. "ක්‍රීඩාව හා මිත්‍රත්වය" යන්න තේමා කොටගත් මෙම උළෙල ලොව පුරා රාජ්‍යයන් 150 ක පමණ සහභාගීත්වයෙන් සෑම වර්ෂයක් පුරාම අඛණ්ඩව පවත්වනු ලබයි. මෙම "CISM" ධාවනය කොළඹ ප්‍රදීපාගාර පරිශ්‍රයෙන් ආරම්භ කෙරුණු අතර, ගාලුමෝදර පිටිය වෙත ගමන් කිරීමෙන් අනතුරුව නැවතත් එම මාර්ගයේ පැමිණ අවසානය සනිටුහන් කරන ලදී.

# වෘත්තීය දැනුම බෙදාදෙමින්...

යුද්ධ හමුදා රණවිරුවන් හට මල් සැරසිලි පිළිබඳ වෘත්තීමය දැනුමක් ලබාදීම උදෙසා පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක් 2020 පෙබරවාරි 10 දින හෝමාගම "ලස්සන ෆ්ලෝරා" ඇකඩමියේදී ආරම්භ කෙරිණ. යුද්ධ හමුදාව සිදුකරනු ලබන උත්සව සඳහා මල්සැරසිලි සිවිල් ආයතන වෙතින් මුදල් ගෙවා ලබාගැනීමට සිදුව ඇති බැවින් ඊට විසඳුමක් ලෙස සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණි සුජීවා නෙල්සන් මහත්මියගේ සංකල්පයකට අනුව මෙම පාඨමාලාව සංවිධානය කරන ලදී.

"ලස්සන ෆ්ලෝරා" ආයතනයේ සභාපති විශේෂඥ වෛද්‍ය ලසන්ත මලවිගේ මහතාගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබන එම පාඨමාලාව යුද්ධ හමුදාව වෙත කරන ගෞරවයක් සේ සලකා කිසිදු මුදල් අයකිරීමකින් තොරව සිදුකිරීම විශේෂත්වයකි. මෙහිදී යුද්ධ හමුදා රණවිරුවන් 10 දෙනෙකු සඳහා මාස 06 ක කාලසීමාවක් මෙම පාඨමාලාව පැවැත්වේ.





# යුද්ධ හමුදා මූලස්ථානයට අංග සම්පූර්ණ මුළුතැන්ගෙයක්...





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් පවත්වාගෙන යනු ලබන ආහාර ව්‍යාපෘති යටතේ යුද්ධ හමුදා මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරනු ලැබූ මුළුතැන්ගෙය ජ්‍යෙෂ්ඨ ආරක්ෂක මාණ්ඩලික සම්බන්ධීකරණ නිලධාරී බ්‍රිගේඩියර් එන්ආර් ළමාහේවා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් 2020 ජනවාරි 31 දිනට එළඹි සුබ මොහොතින් විවෘත කෙරිණ. යුද්ධ හමුදාධිපතිතුමාගේ උපදෙස් මත යුද්ධ හමුදා මූලස්ථානය තුළින් ප්‍රාදේශීයව සොයාගන්නා ලද ඉදිකිරීම් අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් සේවා වනිතා ඒකකයේ මූල්‍ය පිරිවැය හා ඉංජිනේරු සේවා බළකා රණවිරුවන්ගේ පූර්ණ ශ්‍රමදායකත්වය මත මෙම ආහාර ව්‍යාපෘති ගොඩනැගිල්ල ඉදිකිරීම විශේෂත්වයකි. යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී නියුතු නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් 2500 කට අධික කාර්ය මණ්ඩලයක් වෙත උදෑසන, දිවා හා රාත්‍රී ආහාර සහනදායී මිල ගණන් යටතේ මෙන්ම ප්‍රණීතව හා පිරිසිදුව පිළියෙල කර ලබාදීම මෙහි ප්‍රධාන අරමුණයි.

# අධ්‍යාපනයට අත්වැලක්...



රට වෙනුවෙන් දිවිපිදූ, ආබාධිත මෙන්ම සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සහ සිවිල් සේවකයින්ගේ පවුල්වල සිසු දරුදැරියන් සඳහා සිදුකළ අධ්‍යාපනික සත්කාරයක් පසුගිය පෙබරවාරි 26 දින කොළඹ පිහිටි ආරක්ෂක සේවා විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. සුජීවා නෙල්සන් මහත්මියගේ සභාපතීත්වයෙන් යුත් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සුභසාධන කටයුතු තවදුරටත් පුළුල් කරමින් සිදුකරන මෙම මූල්‍යාධාර ප්‍රදනෝත්සවය මගින් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස සා/පෙළ විභාගය සහ අ.පො.ස උ/පෙළ විභාගය ඉහලින් සමත් සිසු සිසුවියන් දිරිගන්වමින් රුපියල් මිලියන 3.5 කට වඩා වටිනාකමකින් යුත් ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යංශයේ සේවා වනිතා ඒකකයේ සභාපතිනී චිත්‍රානි ගුණරත්න මහත්මිය සහභාගි වූ අතර, සම්භාවනීය ආරාධිත අමුත්තා ලෙස වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.

## කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව...



කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවට අයත් රණවිරුවන් දෙදෙනෙකු වෙත නිවාස ඉදිකිරීම සඳහා වූ මූල්‍ය ප්‍රදානයක් 2020 පෙබරවාරි 11 දින එම රෙජිමේන්තු සේවා වනිතා සභාපතිනී කුමුදූණී වනිගසූරිය මහත්මියගේ සුරතින් සිදුකෙරිණ.

මේ යටතේ සෙ/157790 බෝම්බොඩියර් දසනායක පීජීආර් වෙත රුපියල් 200,000 ක් හා ලාන්ස් බොම්බොඩියර් කුමාරසිරි කේජීඑන් වෙත රුපියල් 700,000 ක මූල්‍ය ප්‍රදානයක් හිමිවූහ. කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිනියක වූ ලුද්මිලා ද සිල්වා මහත්මියගේ මැදිහත්වීමෙන් සිදුකෙරුණු මෙම මහැගි සත්කාරයට ජෝන කීල්ස් සමාගමේ ක්‍රිශාන් බාලේන්ද්‍රන් යන අය විසින් අනුග්‍රාහකත්වය සපයන ලදී.

## ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය යටතේ රාජකාරී කර වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ සෙ/4බී00970 ඉසෙ සමන්ත යන රණවිරුවා වෙනුවෙන් නව නිවසක් පරිත්‍යාග කිරීම 2020 ජනවාරි 29 දින සුබ මොහොතින් සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ඉංජිනේරු බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණි සාගරා ගුණවර්ධන මහත්මිය, යාන්ත්‍රික ඉංජිනේරු බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එන්පීජ් ගුණවර්ධන ආර්එස්පී, ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, එම බළකායේ නිලධාරීන්, සෙබලුන් ඇතුලු විශාල පිරිසක් සහභාගී වූහ.

## සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...





ක්‍රියාන්විත හේතූන් මත මියගිය, අබාධිත, සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ දුවාදරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් 2020 ජනවාරි 25 දින සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම් මුදන්නායක ආර්එස්පී යූඑස්පී සහ එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණි ප්‍රියමාලී මුදන්නායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු එම අධ්‍යාපනික සත්කාරයේදී දුවාදරුවන් 49 දෙනෙකු සඳහා රුපියල් 6000 ක් වටිනා පාසල් උපකරණ කට්ටලය බැගින් පිරිනමන ලදී. ඒ සඳහා වූ මූල්‍යමය දායකත්වය ලබාදී තිබුණේ අර්ල්ස් කෝට් සමූහ කළමනාකරණ අධ්‍යක්ෂ එමාල් ගුණසේකකර මහතා විසිනි.

## සේවා බළකා සේවා වනිතා ශාඛාව...





යුද්ධ හමුදා සේවා බළකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කළ "ධනාත්මක චින්තනය සහ මානසික ආතති කළමනාකරණය" යන තේමාව යටතේ වූ අර්ථාන්විත දේශණයක් 2020 ජනවාරි 26 දින රෙම ශ්‍රීලයුපොදුසේබ දේශණ ශාලාවේදී පැවැත්විණ. දිවයිනේ ප්‍රවීණ උපදේශිකාවක් වන අමා දිසානායක මහත්මිය විසින් පැවැත්වූ මෙම දේශනයට සේවා බළකා සේවා වනිතා සාමාජිකාවන් රැසක් සහභාගි වූහ.

## වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාව...



ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරුවන්ගේ පාසල් අධ්‍යාපනය හදාරන දූ දරුවන් තිදෙනෙකු හට සහ විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරන දූ දරුවන් 07 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර පිරිනැමීම 2020 ජනවාරි 15 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවනාගාරයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය බ්‍රිගේඩියර් ඩීටීඑන් මුණසිංහ යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සිදුකරනු ලැබූ මෙම කටයුත්තට වෛද්‍ය බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගි වූහ.

# ඉන්දීය විරුවන් සිහිකෙරේ...

ශ්‍රී ලංකාවේ සාමසාධක රාජකාරී සඳහා පැමිණ මියගිය ඉන්දීය සෙබලුන් සිහිපත් කිරීමේ උත්සවයක් 2020 ජනවාරි 26 දින පලාලි පිහිටි ඉන්දීය රණවිරු ස්මාරකය අභියසදී පැවැත්විණ. 70 වන ඉන්දීය නිදහස් දිනයට සමගාමීව පැවැත්වුණු එම සැමරුම් උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස ඉන්දීය කොන්සල් ජෙනරාල් එස් බාලචන්ද්‍රන් මහතා සහ යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී සහභාගි වූහ.











## තෛපොංගල් දින අර්ථවත් සැමරුමක්...

55 සේනාංකයේ අධීක්ෂණය යටතේ 551 බළසේනා මූලස්ථානය මගින් සංවිධානය කළ තෛපෝංගල් සැමරුම් උත්සවයක් හා කෝවිල් පූජාවක් 2020 ජනවාරි මස 15 දින වල්ලිපුරම් ශ්‍රී අල්වාර් කෝවිලේදී පවත්වන ලදී. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණ මෙම උත්සවයට 51 සහ 55 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන්, සෙබලුන් සහ සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගි වූහ.

# රණවිරුවන්ගේ සුවදුක් සොයා බලමින්...





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජ්එම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී අනුරාධපුර අභිමංසලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන සෙබලුන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා පසුගිය ජනවාරි 29 දින සංචාරයක නිරත විය. මෙම සංචාරය තුළදී නේවාසික ප්‍රතිකාර ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සුභසාධන අවශ්‍යතාවයන් පිළිබඳ සොයාබැලූ හෙතෙම එම වාට්ටු සංකීර්ණ විමර්ශනය කර සෙබලුන් සමග සුහද පිළිසඳරක නියැලෙන්නටද අමතක නොකළේය. එසේම ඔවුන් වෙත ත්‍යාග පාර්සල් බෙදාදීමක්ද සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා 21 සේනාංකයේ සේනාංකාධිපති, ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති, සේවා බළකා පුහුණු පාසලේ සේනාවිධායක, යුද්ධ හමුදා රෝහල - අනුරාධපුර අණදෙන නිලධාරී මෙන්ම ජ්‍යෙෂ්ඨ නිලධාරී නිලධාරිණියන් රැසක් සහභාගි වූහ.

# සංචාරයක සටහන්...

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජ්එම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී පසුගිය ජනවාරි 25 දින ඉංජිනේරු බළසේනා මූලස්ථානය වූ ඔය කඳවුරේ සංචාරයක නිරත විය. එහිදී ඉංජිනේරු බළසේනාධිපති බ්‍රිගේඩියර් ජ්එන් අමරසේකර යූඑස්පී එන්ඩීයූ විසින් ආඥාපති පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු සම්මාන මුරයක්ද පිරිනමන ලදී.
සිය සංචාරය තුළ කඳවුරේ රාජකාරී ස්වභාවය හා භට පිරිස්වල පාලන අවශ්‍යතා පිළිබඳ ආඥාපතිතුමන්ගේ නිරීක්ෂණයට බඳුන්විය. මෙම අවස්ථාව සඳහා ඉංජිනේරු බසේමු බළසේනාධිපති හා ඉංජිනේරු බළසේනාවේ ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිලධාරීන් මෙන්ම සෙසුනිලයින් රැසක් ද සහභාගි වූහ.





# ආදිවාසී ජන උරුම විහාරස්ථානයට මුල්ගල තැබේ...

පාගොඩ ගුරුකුඹුර ආදිවාසී ජන උරුම විහාරස්ථානයේ ඉදිකිරීමට නියමිත චෛත්‍ය රාජයාණන් වහන්සේට මුල්ගල තැබීමේ පිංකම සඳහා ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී සහභාගි විය. ඉකුත් ජනවාරි මස 25 දින පැවති මෙම පිංකම සඳහා සියම් නිකායේ අස්ගිරි පාර්ශවයේ අනුනායක වරකාගොඩ ගුණරතන මහා නායක හිමියන්, නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ ප්‍රධාන සංඝනායක වතුරකුඹුරේ ධම්මරතන නායක හිමියන්, ගම්පහ බවුන්පැලැස්ස ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ නිර්මාතෘ වල්පොල ගෝතම හිමියන් ඇතුලු බෞද්ධ භික්ෂූන් වහන්සේලා රැසක් සහභාගි වූහ. ඊට අමතරව ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිලා ඇත්තෝ ඇතුලු ආදිවාසීන් පිරිසක් ද බැතිමතුන් පිරිසක් ද සහභාගි වූහ.





## පින් බිමට මුල්ගලක්...





පච්චනූර් හි කොට්ටියරමුල්ල රජමහා විහාරයේ විහාර සංවර්ධන පදනමේ සභාපති මහාචාර්‍ය කපිල ගුණවර්ධන මහතාගේ ආරාධනයෙන් ආරක්ෂක සේනා මූලස්ථාන (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ආර්එන් ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී විසින් ඉකුත් ජනවාරි 10 දින එම විහාරස්ථානයේ නව බුද්ධ ප්‍රතිමා වහන්සේ නිරාවරණය කර යෝජිත දාගැබ සඳහා මුල්ගල තබන ලදී. මෙම උත්සවය සඳහා සේරුවිල මංගල රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය මුංහේනේ මෙත්තාරාම හිමියන්, සේරුවිල පච්චනූර් කොට්ටියාරමුල්ල රජමහා විහාරයේ වත්මන් විහාරාධිපති පූජ්‍ය බලල්ලේ රත්නසාර හිමියන්, නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ගරු අනුරාධ යහම්පත් මහතා, 22 සේනාංකයේ සේනාංකාධිපති, 223, 222 බළසේනාවන්හි බළසේනාධිපතවරුන් ඇතුලු බැතිමතුන් විශාල පිරිසක් සහභාගි වූහ.

# ඒකක සංචාරයන්හි නිරතවෙමින්...





ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් පෙබරවාරි 11 දින 652 බළසේනාවේ සහ ඒ යටතේ පාලනය වන 7 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක නිරතවිය. තවද 574 බළසේනාව යටතේ ඇති 3 වන ගජබා රෙජිමේන්තුව, 9 වන විජයබාහු පාබල රෙජිමේන්තුව හා 57 සේනාංක බළඇණි පුහුණු පාසල ද ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.

නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම, කාර්යක්ෂමතාව මෙන්ම විනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා පුහුණුව තුළින් ලැබෙන වැදගත්කම පෙන්වා දෙමින් එහිදී ආඥාපති විසින් හට පිරිස් ඇමතීමටද කටයුතු කළේය.

# ඒකකයන්හි පාලන කටයුතු සොයා බලමින්...





ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජනවාරි 30 දින 65 සේනාංකයේ සහ ඒ යටතේ ඇති ඒකකයන්හි නිරීක්ෂණ චාරිකාවක නිරතවිය. තවද 17(සේවි) ශ්‍රී ලංකා පාබල හමුදාව, 19 ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකය මෙන්ම බළඇණි පුහුණු පාසල මුලන්කාවිල් ද ආඥාපතිගේ නිරීක්ෂණයට බඳුන්විය.

එහිදී 65 සේනාංකයේ සේනාංකාධිපති ගේ ආරාධනයට අනුව ආඥාපති විසින් එහි හට පිරිස් අමතන්නටද අමතක නොකළේය. මෙම අවස්ථාවට 651 සහ 653 බළසේනාවන්හි බළසේනාධිපතිවරුන්ද සහභාගි වූහ.

# සුහදත්වය වර්ධනයට සුහද හමුවක්...








ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සංකල්පයකට අනුව එම බලප්‍රදේශයේ ඇති රාජ්‍ය/පුද්ගලික ආයතන සමග මෙතෙක් පවත්වාගෙන ආ සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා වූ සුහද හමුවක් ඉකුත් පෙබරවාරි 13 දින ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) නිලධාරී නිවස්නයේදී පවත්වන ලදී. මෙම රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා මහේස්ත්‍රාත්තුමා මුලතිව්, නියෝජ්‍ය පොලිස්පති මුලතිව්, 59, 64, 68 සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, වැලිඔය සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම්, වෛද්‍ය නිලධාරීන් දිස්ත්‍රික් මහ රෝහල මුලතිව් ඇතුලු රාජ්‍ය, පුද්ගලික ආයතනයන්හි සේවය කරන නිලධාරීන් විශාල පිරිසක් සහභාගි වූහ.

# ධර්ම දේශනයක්...

ශ්‍රී ලංකාවාසී සැමටත් ස්වාභාවික උවදුරු සහ අනපේක්ෂිත සිදුවීම්වලින් මියගිය ශ්‍රී ලාංකික හා ලෝකවාසී සැමට සෙත්පතා සංවිධානය කෙරුණු විශේෂ බෝධිපූජා පිංකමක් පසුගිය ජනවාරි 14 දින මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථාන මූලදීප විහාරයේ දී පවත්වන ලදී. ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම බෝධිපූජා පිංකම සඳහා කෝකිලායි විහාරස්ථානයේ විහාරාධිපති තිස්සපුර ගුණරත්න ස්වාමීන් වහන්සේ වැඩමකළ අතර, එම පිංකමට ආරක්ෂක සේනා මූලස්ථානය සහ ඒ යටතේ ඇති ඒකකයන්හි නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.









# අභිමන් දින පෑ විකුමන් පෙළහර...

## [72 වන ජාතික නිදහස් සැමරුම]

72 වන ජාතික නිදහස් දින උත්සවය 2020 පෙබරවාරි 04 දින කොළඹ ටොරින්ටන් හි පිහිටි ඓතිහාසික නිදහස් චතුරස්‍රයේදී මහත් අභිමානයෙන් සමරන ලදී. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු එම අවස්ථාවට ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ද එක්විය. එසේම ජනාධිපති ආර්යාව, අග්‍රාමාත්‍ය ආර්යාව, ආරක්ෂක ලේකම්, මැති ඇමතිවරු, ත්‍රිවිධ හමුදාධිපතිවරු, දෙස් විදෙස් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් ඇතුලු සම්භාවනීය අමුත්තන් රැසක් ද ඊට සහභාගි වූහ.

එම අභිමානවත් අවස්ථාවේ තවත් විශේෂත්වයක් වූයේ වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙරටට පැමිණි විශිෂ්ඨ ගණයේ රුසියානු හමුදා නිලධාරියෙකු වන රුසියානු ජනරජ භූමි මෙහෙයුම් ප්‍රධානී ජෙනරාල් ඔලෙග් සැලියුකෝව් ද එක්වීමය.

6000 කට ආසන්න ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක බළකා සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ජව බල සපිරි ප්‍රතාපවත් සම්මාන පෙළපාලියට පාසල් සිසුන් ඇතුලු වෙනත් කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ සංස්කෘතිකාංග එහි විචිත්‍රත්වය තව තවත් වැඩිකරනු ලැබුවේ නිදහස් කාහල නාදය ගුවන, දියඹ හා දෙරණ සිසාර පතුරුවමිනි.











## නව උඩරට භාවනා මධ්‍යස්ථානය යුද්ධ හමුදාධිපති සුරතින් විවෘත වෙයි...

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බරට ආසන්නයේ දර්ශනීය කඳුකර භූමි භාගයක පිහිටි උඩපිටිවල ඉදිකරනු ලැබූ නව උඩුදුම්බර "සමථ විදර්ශනා" භාවනා මධ්‍යස්ථානය පසුගිය පෙබරවාරි 29 දින මහා සංඝ රත්නය වෙත භාරදෙනු ලැබීය. එම අවස්ථාවට සම්භාවනීය අමුත්තන් ලෙස අතිපූජ්‍ය වරකාගොඩ ඥානරතනාභිධාන ස්වාමීන් වහන්සේ, අස්ගිරි මහනායක හිමියන්, අතිපූජ්‍ය නිරම්පනාවේ ආනන්ද ස්වාමීන් වහන්සේ, අස්ගිරිය පිරිවෙනේ පිරිවෙනාධිපති සහ අස්ගිරි අනුනායක හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා රැසක් මෙන්ම ශ්‍රී දළඳා මාලිගාවේ දියවඩන නිලමේ නිලංග දැල බණ්ඩාර, වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ මධ්‍යම පළාත් නියෝජ්‍ය පොලිස් පරීක්ෂක රොෂාන් ප්‍රනාන්දු ඇතුළු පිරිසක්ද සහභාගි වූහ.





බුදු සසුන වෙනුවෙන් කරනු ලැබූ පුණ්‍යමය පරිත්‍යාග යක් වශයෙන් හිටපු ජ්‍යෙෂ්ඨ (විශ්‍රාමික) උප පොලිස් පරීක්ෂක නිමල් මැදිවක ඇතුළු එතුමන්ගේ පවුලේ සාමාජිකයින් විසින් මෙම භාවනා මධ්‍යස්ථානය වෙනුවෙන් ඔවුන්ගේ පෞද්ගලික ඉඩමක් පරිත්‍යාග කරනු ලැබූ අතර, එහි අභිනවයෙන් ඉදිකරනු ලැබූ භාවනා මධ්‍යස්ථානය තුළ භික්ෂූන් වහන්සේලාට භාවනා සුවයෙන් පසුවීමට තැනූ විශේෂ කුටි, ආරාම, දාන ශාලාවන් ඇතුළු අනෙකුත් සියලුම පහසුකම් වලින් සමන්විතය.

# සෙසුනිල අයිතියට නව සෙවණක්...

පනාගොඩ යුද්ධ හමුදා ජනපදය වෙත දෛනිකව රාජකාරී සඳහා පැමිණෙන යුද්ධ හමුදා සාමාජිකයින්ව ක්‍රමානුකූලව පරීක්ෂා කිරීමට හා එම තොරතුරු ලේඛනගත කිරීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉකුත් පෙබරවාරි 05 දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ ප්‍රධාන දොරටුව අසල විවෘත කරන ලදී. බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් මත ඉදිකරනු ලැබූ මෙම ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.









# කෙඩෙට් නිලධාරී අධ්‍යයන සංචාරයක්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය - දියතලාව වෙතින් පුහුණුව ලබන පාඨමාලා අංක 88 හි කැඩෙට් නිලධාරීන් 38 දෙනෙකු ඉකුත් පෙබරවාරි 09 දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) අධ්‍යයන සංචාරයක් සිදුකරන ලදී. බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්එල් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි එම ආරක්ෂක සේනා මූලස්ථාන ප්‍රමානි 11(පුහුණු) මේජර් ජ්ර්ඕ ගමගේ විසින් ආසේමු හි පැවරී ඇති කාර්යභාර්යය, වගකීම සහ එහි ඉතිහාසය පිළිබඳ එහිදී කෙඩෙට් නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. එම අවස්ථාවට ආරක්ෂක සේනා මූලස්ථාන බ්‍රිගේඩියර් ප්‍රමානි බ්‍රිගේඩියර් ඩීඑම්යූජී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුලු නිලධාරීන් රැසක් ද සහභාගි වූහ.

# පහසුකම් සලසා දෙමින්...







දියතලාවේ පිහිටි ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් සඳහා ඉදිකළ නේවාසිකාගාරයක් සහ නව ජල පොම්පාගාරයක් ඉකුත් පෙබරවාරි 07 දින ආරක්ෂක සේනා මූලස්ථානය මධ්‍යම ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ විසින් විවෘත කරන ලදී.

එම ජල පොම්ප කිරීමේ ඒකකය තුළින් දිනකට ජලය ලීටර් 160,000 ක ධාරිතාවක් පොම්ප කිරීමේ හැකියාවක් පවතින අතර, පුහුණු පාසලේ සියලු සාමාජිකයින් වෙත ප්‍රමාණවත් තරම් ජලය සැපයීමේ හැකියාව ඊට ඇත.

---

# හරවත් වැඩමුලුවක්...







පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් "Training Programme for Middle Grade Officers of the Sri Lanka Army"යන තේමාව යටතේ පුහුණු වැඩමුලුවක් ඉකුත් ජනවාරි 06 දින සිට ජනවාරි 09 දින දක්වා 1 වන ගැමුණු හේවා බළඇණියේ දේශන ශාලාවේදී සාර්ථක අයුරින් පවත්වන ලදී. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන සේනාංක, බළසේනා, පුහුණු පාසල් සහ ඒකකයන්හි රාජකාරී නියුතු මේජර් සහ ඉන් පහල නිලධාරීන් 25 ක් මෙම වැඩමුලුව සඳහා සහභාගි වූහ. එහි දේශක මඩුල්ල වශයෙන් Soft Skillz International ආයතනයේ අධ්‍යක්ෂිකා සුලක්ෂනා ප්‍රනාන්දු මහත්මිය සහ කපිතාන් සුමේධ මිරිහාන (විශ්‍රාමික) සහභාගි වූහ.

සන්නිවේදන නිපුනතා, කථන හැකියාව, ඉදිරිපත් කිරීමේ නිපුනතා, නායකත්ව නිපුනතා පෞරුෂත්ව වර්ධනය වැනි මාතෘකාවන් රැසක් එම වැඩමුලුව යටතේ ආවරණය විය.

කෙටි කතාව

2009 මැයි 18 අප රටෙහි තිස්වසක කුරිරු යුද්ධය අවසන් කළ ඓතිහාසික දිනයයි. යුද්ධය නිමවීමත් සමග රටපුරා සැණකෙළිසිරි ගත්තේ දශක තුනක් තිස්සේ මෙරට ජනතාව ඒ හේතුවෙන් අසීමිත දුක්කන්දරාවක් ඉසිලූ හෙයිනි. යුද්ධය අවසන් වූ මුල් වකවානුවේ ලියවුණු මෙම කෙටිකතාව අදට සාපේක්ෂව එතරම් වලංගුබවක් නොපෙන්නුවද එවක රණවිරුවන් පිළිබඳ ඇතැමුන්ගේ සිත්සතන් තුළ වූ හැඟීම යම්තාක්දුරට මෙහි පිළිඹිබු කෙරෙනු ඇත.

# මොකට බයවෙනවද යුද්දේ ඉවරයි...

වජිරා දෙස ආදරණීය බැල්මක් හෙලූ දයානන්ද ඇඳ මිට්ටමට හේත්තු විය.

"මේ ඒක නෙවෙයි දයා එනපාර ඉඳන් දුෂ්කරේ කැපෙයිද ?" දෙගිඩියාවෙන් යුතුව වජිරා ඇසුවාය.

"දුෂ්කරේ නං කැපෙන එකක් නෑ හැබැයි මරබිය නම් කැපෙයි"

"මොකක් මරබිය" වජිරා තිගැස්සුනාය.

"ඔව් ඔව් මරබිය. අර අධිප්‍රහාරක දීමනාව" දයානන්ද පැහැදිලි කරන්නට විය.

"මම දන්න මර බියක් නැහැ අනේ. හැබැයි මෙදාපාරත් පාටි වලටයි, අරවටයි මේවටයි කියලා ඔයාගෙ පඩිය එහෙම අඩුකරගෙන තිබුණොත් ඔයා මට ගෙවන්න "විලිබිය දීමනාවක්" නැත්තම් හෙට අනිද්දට මට වෙන්නේ ලැජ්ජාවේ පාරේ බැහැලා යන්න බැරි වෙන එකයි. තොග කඩේ මුදලාලිගෙ ණය බේරුවේ නැහැ. තව එහෙං බැංකු වාරිකේ ඇරියස්. ටෙලිෆෝන් එකත් කොයි වෙලාවේ කපයිද දන්නෑ. ඔයාට නම් ගාණක් නෑ. මම එපායෑ සේරම සුමේ කරන්න"

දිගින් දිගට නගන වජිරාගෙ මැසිවිලි හමුවේ දයානන්ද නිශ්ශබ්දව අසා සිටියා පමණි. වජිරාගේ වදන් දයානන්දගේ නොසතුටට හේතු වුවද ඔහු ඒ බවක් නොපෙන්නුවේය.

"දැන් නම් ඔයාලට බය වෙන්න දෙයක් නැනෙ. යුද්දේ ඉවරයිනෙ. ඇත්තටම මේ දවස්වල එහෙ මොනවද කරන්නේ දයා" විරාමයට පසු වජිරා නැවතත් කටහඬ අවදි කළාය.

"යුද්දෙ ඉවරා වුනාට ඉතින් රාජකාරී අඩු නෑ" දයානන්දගේ පිළිතුරෙන් වජිරා සෑහීමකට පත් නොවීය.

"ඇයි අනේ ප්‍රභාකරනුත් මැරුවා. උගේ හිටපු රොත්ත බුරුත්තම ඉවරයි. තවත් මොනවද? වජිරාගේ ස්වරය දැඩිවිය.

"ඉතිං වජිරා කොටි මැරුවයි කියලා සේරම අකුලන් මෙහෙ එන්නද කියන්නේ" දයානන්ද එක එල්ලේ ඇ දෙස බලමින් පැවසුවේය.

"නැතුව ඉතිං වෙන අහවල් කජ්ජකට එහෙ ඉන්නවද"

"අනේ අම්මපා මේ ගෑනුන්ට මොලේ මංචාඩියක් තරම්වත් නැති හැටි" මේ දවස්වල තමයි වජිරා එහෙ වැඩ වැඩි. රිසෙට්ල්මන්ට් රීඩිප්ලොයිමන්ට් එහෙන් ගියාම අයිඩීපී

"ඇති ඇති ඇති මට ඔය කෙහෙල්මල් සෙට්ල්මන්ට් තේරෙන්නේ නෑ. මම දන්න එකම දේ ඔයා මේ දවස්වල ගෙදර එන්නත් පසුගිය විසි අවුරුද්ද පුරාම ගෙදර ආපු පිළිවෙලටම තමා.

දැන් යුද්දෙ කාලේ වගේ පරක්කු වෙන්නේ නැනේ වජිරා. විසිතුනකට අටක් එනවනෙ." ඇය අස්වසනු රිසියෙන් ඔහු පැවසුවේය.

"අපොයි ඔව් එනව එනව ගෙදර එනදාට රට රැ වෙනවා. ආපසු යනදාට කුකුල්ලු කෑගහන්නත් කලින් යනවා. ඔයා ගෙදර ඉන්නේ කී දවසද දයා?" ඇයගේ එම වදන් බෙහෙවින් හැඟුම්බර වුවද දයානන්දට ඇති වූයේ නොසතුටකි.

"හරි හරි මාස ගණන් හමුදාවල නිවාඩු දෙන්නේ නැනෙ වජිරා. පොඩ්ඩක් තේරුම් ගන්නකෝ" දයානන්ද ඇඳ මත මෙතෙක් හුන් ඉරියව්ව වෙනස් කරමින් පැවසුවේය.

"ඒක තමයි මං එදා ඉඳං කට කැඩෙන කල් කියන්නේ වෙන දිහාවකට මාරුවක් ගන්න කියලා" වජිරා සියලු ප්‍රශ්න සඳහා වන තම සුපුරුදු විසඳුම ඒ මොහොතේද ඉදිරිපත් කළේය.

හිතුන හිතුන තැන්වලට මාරු වෙන්න මම ස්වයං රැකියාවක් කරනවා කියලා හිතුවද? ඕනැම නම් කිලිනොච්චියේ ඉඳන් මුලතිව්වලට මාරුවක් ගත හැකි. එහෙම නැත්තම් වව්නියාවේ ඉඳන් මන්නාරමට"

"නෑ හත්දෙයියනේ මම කියන්නේ අඩුම තරමින් අනුරාධපුරෙන් මෙහාටවත්"

වැඩක් වෙන්නේ නෑ වජිරා. ඇඳෙන් නැඟිටගත් දයානන්ද කාමරයේ ජනේලයෙන් ඉවත බලාගෙනම පැවසුවේය.

දයානන්දගේ වදන් හමුවේ වජිරා බොහෝ සේ කෝප ගැන්වී ඇත. "එහෙමනම් ඉතිං ඕකෙන් අයින් වෙන්න" ඇය නෝක්කාඩු ස්වරූපයෙන් කීවාය. සිය බිරිඳගේ වදන් දයානන්දට ඉහිලුම් නොදුන්නේය.

"පිස්සු කතා කරන්න එපා වජිරා. අපි අවුරුදු 30 ක් පෙරහරේ කොට ඇද්දා. දැන් තමයි කරඩුව ගෙනියන්නේ

එක කොහොම වෙතත් ඔයාලා කළේ කොට අදින එක නේන්නම්" වජිරා අවඥා සහගත ලෙස කීය.

තම බිරිඳගේ තොරතොංචියක් නැති කතා අසන්නට තවදුරටත් දයානන්දට සිත් නොදේ. හෙතෙම දොර රෙද්ද ඈත් කරගෙන කාමරයෙන් එළියට ගියේ අසල වූ කනප්පුවද පෙරලාගෙනය.

"ඇයි දයා මේ තේ එක බොන්නේ නැද්ද?" ඇය ඇඳ මත හිඳගෙන උස් හඬින්ම ඇසුවාය.

"එපා වජිරා මට ඔයාගේ කතා අහලා තේ ගැලුමක් බිව්ව ගාණයි" ඔහු වතුර වීදුරුවක් පුරවාගෙන එක හුස්මට බීගෙන ගියේය.

"මේ මනුස්සයාටනම් පිස්සු" වජිරා කාමරයට වී තවත් මොනවාද කියන අයුරු දයානන්දට යාන්තමට ඇසුණි.

"අප්පච්චි කොටි කී දෙනෙක් මරලා තියෙනවද?" ස්තෝප්පුවේ පුටුවට බරවූ දයානන්ද වෙත පැමිණි පුතු විමසීය.

"කව්ද පුතේ ගැන ගැන කොටි මැරුවේ. එහෙම යුද්ද කරන්න පුලුවනෑ." එක එල්ලේ පුතු දෙස බලමින් දයානන්ද පිළිතුරු දුන්නේ මඳක් විමතියෙනි.

"එහෙම කියන්න එපා අප්පච්චි, අංගුලිමාලත් ඇඟිලි කැපුවේ ගැනලනෙ." පුතාගෙ ප්‍රශ්නාවලිය නිමාවන පාටක් නොපෙනේ.

"ඒ අංගුලිමාලනේ පුතා. අනික අංගුලිමාල ඒක කළේ කඩුවෙන්. එතකොට ගනින්න ලේසියි. තුවක්කු බොම්බ එක්ක යුද්ද කරනකොට

> "අප්පච්චි කොටි කී දෙනෙක් මරලා තියෙනවද?" ස්තෝප්පුවේ පුටුවට බරවූ දයානන්ද වෙත පැමිණි පුතු විමසීය.
>
> "කවුද පුතේ ගැන ගැන කොටි මැරුවේ. එහෙම යුද්ද කරන්න පුලුවනෑ." එක එල්ලේ පුතු දෙස බලමින් දයානන්ද පිළිතුරු දුන්නේ මඳක් විමතියෙනි.

කොහේ ගනින්නද?" දයානන්ද දන්නා සිංහලෙන් පැහැදිලි කරන්නට විය.

පුතා කාමරයෙන් පිට වූයේ නොසතුටෙනි. දයානන්දගේ පිළිතුරුවලින් ඔහු සෑහීමකට පත් වූ බවක් පෙනෙන්ට තිබ්ණේ නැත. "මේ ළමයින්ටත් අම්මපා අහන්නම වෙන දෙයක් නැතුවද? වැඩක් නැති ප්‍රශ්න අහන්නේ" දයානන්ද තමාටම කියා ගත්තේය.

"ආ දයානන්ද පුතා කවදද ආවේ" පන්සල පැත්තට යමින් සිටි දයානන්දගෙන් අතරමඟදී හමුවූ විල්බට් මාමා බොහෝ ලෙන්ගතු ලෙස ඇසීය.

"ඊයේ ආවේ මාමේ. මම මේ පන්සල පැත්තේ යනවා"

"ආ ඒක හොඳා අනික දූන් ඉතිං නිවාඩු එන්න කරදරේකුත් නෑනෙ. යුද්දෙත් ඉවරයිනෙ නේද?"

කිසිත් නොදෙඩූ දයානන්ද ඔහු වෙත සිනහවකින් සංග්‍රහ කොට පන්සල දෙසට හැරුණි. යුද්ධය ඉවර වුණ නිසාවෙන් හමුදාවේ හැමෝටම නිවෙස්වලට වී සිටිනු දැකීම විල්බට් මාමාගේ අදහස වූවාදැයි දයානන්දට සිතුණි.

පන්සල් වත්ත වෙනදාට වඩා පාළු ස්වභාවයක් ගෙන තිබුණි. ගේට්ටුවෙන් ඇතුල්වත්ම එහි වෙනස හොඳින් දයානන්දට දැනුණි. මීට පෙරදී පොහොය දින තරමට එහි නිරතුරු සෙනඟ ගැවසෙනු දැකිය හැකිවිය. විශේෂයෙන්ම යුද්ධය උත්සන්නව පැවති කාලසීමාවේදී රණවිරු බිරින්දෑවරුන් හා මාපියන් බෝධිය වටා එක පොදියට රොක්වී සිටීම එකල සුලබ දසුනකි. බැරල් ගණන් වතුර කල පුරවා බෝධිය නැහැවීම බෝධියට ඔරොත්තු නොදෙන තරම් විය. නෙක නෙක නම් කෙටූ කොඩිවැල් එල්ලීම හේතුවෙන් බෝ ගසේ අතු පවා පහත් වූ සෙයකි. එවක පැවති යුද්ධය හමුවේ රණවිරුවන්ගේ ජීවිතවල තිබූ අවධානම කෙසේද යන්න මේ බෝ ගස සාක්ෂි දරණු ඇති බවට දයානන්ද සිතීය. රණවිරු බිරින්දෑවරුන්ගේත්, දූවාදරුවන්ගේත්, දෙමාපියන්ගේත් දහසකුත් එකක් දුක්ඛ දෝමනස්සයන් බිය සංකා සියල්ල අවශෝෂණය කර ගනිමින් ඔවුනට සිසිල සෙවණ හා ශාන්තිය ලැබ දෙන්නට මේ බෝ සමිඳුන් ඉටුකළ මෙහෙවර කෙතරම්දැයි ඔහුට සිතිණි. එහෙත් ඒ බෝ ගස පාළුවට ගොසිනි. එකිනෙකා නමින් එල්ලූ කොඩිවැල් ගැලවී අපිළිවෙලට එල්ලෙමින් තිබේ. අවශ්‍ය තරම් ජලය නොලැබීමෙන් බෝගසේ පෙනුමද මලානික වී ගොසිනි. දයානන්දගේ සිතට නැගුනේ කෝපයකි. "අනේ අම්මපා එකෙකුටවත් කළගුණ මතක නැති හැටි. අපේ මිනිස්සුන්ට දූන් පන්සලත් අමතකයි" හේ තමාටම කියාගත්තේය.

"ආ... මේ අපේ දයානන්ද මහත්තයානේ. කවද්ද ගමේ ආවේ" දැඩි කල්පනාවක නිමග්නව සිටි දයානන්ද ලොකු හාමුදුරුවන්ගේ කටහඬින් තිගැස්සුණේය.

"ඊයේ ආවේ ලොකු හාමුදුරුවනේ. පන්සල පැත්තේ ඇවිත් යන්න හිතුනා." ඔහු කටහඬ අවදි කළේය.


"ඒක කොයි තරම් හොඳද මහත්තයා. දූන් පන්සලට බොහොම දෙනෙක් එනවා අඩුයි. අඩුම තරමේ අර යුද්ද කාලේ ආපු හමුදා පවුල්වල උදවියත් දූන් එන්නේ නෑනෙ. කොටින්ම මහත්තයලාගේ ගෙදර ඇත්තොවත් මම නම් කාලෙකින් දැක්කේ නැහැ. එක අතකට දූන් යුද්ධය ඉවර හින්දා ඒ ඇත්තන්ගෙත් බය ඇරිලා ඇති නේද මහත්තයෝ"

ලොකු හාමුදුරුවෝ එක දිගටම කියාගෙන ගියේය. දයානන්ද ඊට සිනාමුසුව එකඟතාවය පළකළ මිස කිසිවක් නොකීවේය.

"ලබන මාසේ පොඩි නැන්දලාගේ මඟුල් ගෙදර යන්න එනවා නේද?" සිය නිවාඩුව අවසානයේ නැවත කඳවුර වෙත යාමට සූදානම් වෙන දයානන්ද වෙත පැමිණි වජිරා ඇසුවාය.

"ඒ දවස්වලට නිවාඩු ටර්න් එක වැටෙන හින්දා එන්ඩ පුලුවන් වෙයි" දයානන්ද බෑග් එකට ඇඳුම් අහුරන අතරේ පිළිතුරු දුන්නේය.

"පුලුවන් වෙයි කියලා හරියන්නෑ දයා ටර්න් එකක් හදාගෙන හරි එන්න. අනික යුදදෙකුත් නැතිව මොනවද ඔයතරම්"



වජිරා පැවසුවේ නෝක්කාඩුවෙනි.

"ඔව් ඉතිං ඔයාගේ බාප්පවත් CO වෙලා ඉන්නවනම් සුටුස්ගාලා එතහැකි" දයානන්ද කණ්ණාඩියක් තරමට දිලිසෙන්නට පොලිෂ් කළ සපත්තු දෙක පළඳින අතරතුරේ පැවසුවේ ඇගට නොදනීමය.

"ඕක ඉතිං ඔයා හැමදාම කියන කතාවක්නේ" වජිරා මූණ බෙරි කරමින් කීවාය.

දයානන්ද මුදල් පසුම්බිය දිගහැර තියුණු පරීක්ෂාවකට භාජනය කොට පිටුපස සාක්කුවේ රුවා ගත්තේ මඟ වියදම හැරෙන්නට වෙනත් එක් නෝට්ටුවක් හෝ එහි ඉතිරි වී ඇද්දැයි බලමිනි. අනතුරුව කණ්ණාඩිය ඉදිරියට වී ඉදුණු කෙස් අතරේ හෙයාජෙල් තලියක් තැවරූ දයානන්ද අවසන් පරීක්ෂණයෙන් අනතුරුව බෑගයේ සිප් එකද වැසීය.

නිදි පැදුරේ හුන් දුවගේ හා පුතාගේ මුහුණු සිපගත් දයානන්ද රෙදි ගොන්නක් ඇතිරූ බෑගයද කරට දමාගෙන වජිරාගෙන් සමුගෙන නිවසින් එළි බැස්සේ ඔරපෝසුව දෙස බලමිනි. ඔහු සමඟ කඩුල්ල තෙක් ගමන් ගත් වජිරා කටහඬ අවදි කළේ අමතක වූ යමක් කියනු පරිද්දෙනි. "ඉස්සර ඔයා නිවාඩු ඉවර වෙලා ගෙදරින් යනකොට කොච්චරනම් හිතට බයයිද දැන් ඉතිං මොකට බය වෙනවද යුද්දේ ඉවරයිනේ" එකනෙහිම දයානන්ද වජිරා දෙස බැලීය. ඔහුගේ යටිතොල ඇතුලත නැමී දත් අතරට තදවී තිබිණ. කඩුල්ලෙන් පැන ගුරුපාරට වන් දයානන්ද ඉක්මන් ගමනින් නොපෙනී ගියේය.

"ආ මේ අපේ දයානන්ද ළමයනේ... නිවාඩු අහවර වෙලා යනවද?" බස් නැවතුමට ආසන්නවත්ම එහි සිටි ඉස්කොලෙ මහතා පෙරමඟට පැමිණෙමින් ඇසීය.

"ඔව් ඉස්කොලේ මහත්තයා අපට ඉතිං මහ කාලයක් නිවාඩු ලැබෙන්නේ නැනෙ"

"ඒකනම් හැබෑව තමා මහත්තයා ඉන්නේ උඩහමද? මං හිතන්නේ දැං සෑහෙන කාලයක් නේද? ඉස්කොලේ මහතා දුර සිට එන බස් රථයට අත දමන ගමන් පැවසීය."

"ඔව් ඉස්කෝලේ මහත්තයා හමුදාවේ උනාම ඕන දිහාවක වැඩ කරන්න එපායැ" දයානන්දගේ පිළිතුර බස් රථයේ තිරිංග සමඟ මුසු විය.

"ඒක නම් හැබෑව එක අතකට දැන්නම් කොහේ හිටිය මොකද ළමයෝ මොකට බය වෙනවද දැන් යුද්දේ ඉවරයිනේ"

ඉස්කොලේ මහතා පැවසුවේ බසයට නගින අතරතුරදීය. ඔහුගේ පිළිතුරෙන් දයානන්දට නොරිස්සුම් බවක් ඇති වුවද කිසිත් නොදොඩාම ඉස්කොලේ මහතා පිටුපසින් බසයට ගොඩවුණි.

බස් රථය තුළ එතරම් සෙනග ක් නොසිටියද ආසන සියල්ල පිරී පැවතිණි. එහි සිටි කොන්දොස්තර කොලුවා ඉස්කෝලේ මහතා හොඳින් දන්නා හඳුනන අයෙකු වූ බැවින් ඔහුගෙන් හෝ දයානන්දගෙන් මුදල් ලබා ගැනීමට උනන්දු නොවීය.

"කරුණාදාස ළමයෝ මේ මහත්තයා ගොඩක් දුර යන කෙනෙක් අනෙක වැඩ කරන්නේ හමුදාවේ. ඔය කොහෙන් හරි සීට් එකක් අරං දෙන්නකෝ."

ඉස්කෝලේ මහතාගේ ඉල්ලීම කොන්දොස්තර කොලුවාට ඉවතලිය නොඑැකි එකක් විය.

"රායිට් ඉස්කෝලේ මහත්තයා අපි කොහොමත් රණවිරුවන්ට සලකනවා. ඒත් දැන් නම් ඉතිං එච්චර ප්‍රශ්නයක් නැනෙ. යුද්ධය ඉවරයිනේ"

කොන්දොස්තර කොලුවාගෙ න්ද හුරුපුරුදු නැටියම වාදනය වනු ඇසිණි. දයානන්ද ඉහිලුම් නොදුන්නේය. හෙතම හනික බෙල් එක ගසා ගෙන බස් රථයෙන් බිමට පැන්නේ කොන්දොස්තර කොලුවාට හෝ ඉස්කෝලේ මහතාටද කිසිවක් සිතා ගැනීමට ඉඩක් නොතබාය. බස් නැවතුමක් අසලකවත් නැති තාර පාර මැද දයානන්ද හුදකලා විය. තමාගේ මුළු නිවාඩුව පුරාම බිරිඳගේ නොක්කාඩු වදන්ද, ගෝරනාඩුද, දරුවන්ගේ අනොරක් නොවූ ඇවිටිලිද, ගම්මුන්ගේ ප්‍රශ්නාවලිද, ඔහුගේ දෙකන් සිරවී නැවත නැවත රැව්පිලි රැව් දෙන්නා සේය. "ෂික් මුන් හැම එකාගේම කටේ තියෙන්නේ දැන් යුද්ධය ඉවරයි දැන් යුද්දේ ඉවරයි කියලා. හරියට කඩේ පිටි සීනි ඉවර වුනා වගේනේ මුන් යුද්දේ ඉවර වුනා කියන්නේ. මට තව පෙන්ෂන් යන්න තියෙන්නේ මාස කීයද? මේ යක්ෂයට මේ ටිකදොහේ මැරෙන්නැතුව ඉන්න බැරිවුණු හැටි" ඇතින් එන බස් රථයට අත දමන ගමන් දයානන්ද තමාටම කියා ගත්තේය.

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## සිප්සතර හැදෑරීමට දිරියක්



යුද්ධ හමුදා සාමාජිකයින් සහ දමිළ ජනතාව අතර සංහිඳියාව වර්ධනය කරලීමේ අරමුණින් මෙන්ම පාසල් ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කිරීමට දිරිගැන්වීමක් වශයෙන් 64 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සිසුසිසුවියන් 104 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් 2020 ජනවාරි 09 දින ඔඩ්ඩුසුඩාන් සින්නතම්බි විද්‍යාලයේදී පැවැත්විණ. මේ සඳහා ඇමෙරිකාවේ ස්ටේටන් අයිලන්ඩ් බෞද්ධ විහාරයේ පූජ්‍ය කුඹල්ඔලුවේ විමලජෝති හිමි සහ මිනුවන්ගොඩ ලුම්බිණි විහාරයේ විහාරාධිපති පූජ්‍ය ගාල්ලේ පියනන්ද හිමි යන හිමිවරුන් දෙනම විසින් අනුග්‍රාහක දායකත්වය ලබාදී තිබුණි.

## හට නිවාසය සෙසුනිල අයිතියට...





යුද්ධ හමුදා සේවා බළකාය වෙත එක්වන ආධුනික කාන්තා සෙබළියන් හට නවාතැන් පහසුකම් සැලසීම වස් ඉදිකරන ලද හට නිවාසය 2020 ජනවාරි 30 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක විසින් සුභ මොහොතින් විවෘත කරන ලදී.

## කොරෝනා වෛරසය පිළිබඳ දැනුවත් කරයි...






කොරෝනා වෛරසය සහ එය පැතිරී යන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2020 පෙබරවාරි 05 දින ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී පැවැත්විණ. ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති ගේ උපදෙස් මත යුද්ධ හමුදා රෝහල (පනාගොඩ) අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ආර්කේපී පුෂ්පකුමාර ආර්එස්පී විසින් එම දේශනය පවත්වන ලදී. ඒ සඳහා නිලධාරීන් 25 ක් සහ සෙසුනිලයින් 305 දෙනෙකු සහභාගි වූහ.



## සෙසුනිලයින් වෙත සහන සලසමින්...

ගලවා ඉවත් කරන ලද පෙරනිමි ගොඩනැගිල්ලක් නැවත සවිකොට සෙසුනිලයින්ගේ පරිහරණය සඳහා පිරිනැමීම පසුගිය ජනවාරි 30 දින සිදුකරන ලදී. එම අවස්ථාව සඳහා 561 බළසේනාධිපති කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක ගේ ආරාධනයෙන් 56 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජේආර්කේ සේනාරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගි විය. 561 බළසේනාවෙහි රාජකාරී කරනු ලබන සෙසුනිලයින්ගේ මූලික අවශ්‍යතාවයක් සපුරාලීමට මෙමගින් හැකිවිය.

# ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ඇගයීමට ලක්වෙති...





13 වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල - 2019 දෙසැම්බර් 01 දින සිට 10 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවර පවත්වන ලද අතර, එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් යුද්ධ හමුදා පොදුසේවා බළකායට අයත් ලා/කෝප්‍රල් කුමාර වයිඩීඅයි කිලෝග්‍රෑම් 55 බර පන්තියේ බර ඉසිලීම ඉසව්වෙන් ශූරතාවයද, කෝප්‍රල් චතුරංග ජ්පීජීඑම්, කබඩි ක්‍රීඩාවෙන් අනුශූරතාවයද, ආධුනික සෙබළ සිල්වා ඩබ්ලිව්ජ්සී බැඩ්මින්ටන් ක්‍රීඩාවෙන් අනුශූරතාවයද, කාන්තා සෙබළ අරුණ වසන්ති කේඑම් සහ කාන්තා සෙබළ ප්‍රනාන්දු ඩබ්ලිව්ඩීඑස් යන ක්‍රීඩිකාවන් වොලිබෝල් ක්‍රීඩාවෙන් අනුශූරතාවයද දිනාගෙන සමස්ථ ශ්‍රී ලංකාවට, යුද්ධ හමුදාවට මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායටද අභිමානයක් එක්කර ඇත. එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජයග්‍රහණයන් අගයා ඔවුන් වෙත තිළිණ ප්‍රදානය කිරීමක් සහ ඔවුන්ව පිළිගැනීමේ උත්සවයක් 2019 දෙසැම්බර් 24 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේදී බළකාධිපති මේජර් ජෙනරාල් සීකේ හඳුන්මුල්ල ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

## සුහදත්වය වර්ධනයට ක්‍රිකට් තරඟාවලියක්...



යුද්ධ හමුදා දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම සහ වෙනත් දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම් අතර තරඟාවලියක් 72 වන නිදහස් උළෙලට සමගාමීව පොලොන්නරුව කළුකැලේ සී/ස ජනතා සමාගම විසින් කළුකැලේ මහවැලි ක්‍රීඩාංගනයේදී 2020 පෙබරවාරි 04 දින පවත්වන ලදී. එහිදී තරඟාවලියේ වීරයා වශයෙන් බී 1 කාණ්ඩයෙන් සැරයන් සහන් කුමාර, බී 2 කාණ්ඩයෙන් මේජර් ෂෙහාන් පෙරේරා සහ බී 3 කාණ්ඩයෙන් බනි 1 රුවන් කරුණාරත්නද දක්ෂතම ක්‍රීඩකයා සඳහා කුසලාන දිනාගත් අතර, රණවිරු සෙවන කණ්ඩායම එහි කුසලානය දිනාගන්නා ලදී.



## "තුරු මිතුරු නව රටක්"

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 72 වන නිදහස් උත්සවයට සමගාමීව 2(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් ඒකක මූලස්ථානයට පිවිසෙන මාර්ගය දෙපස හා කඳවුර තුළ යුද්ධ හමුදා "තුරු මිතුරු නව රටක්" ව්‍යාපෘතිය යටතේ අඹ පැළ 66 ක් සියලු නිලයින්ගේ දායකත්වයෙන් 2020 පෙබරවාරි 04 දින රෝපණය කරන ලදී.





## 40 වසක් නොනැවතී පෙරට...

හයි කාර්ය සම්පාදන අණසක මූලස්ථානයේ 40 වන සංවත්සරය 2020 ජනවාරි 03 දිනට යෙදී තිබූ අතර ඒ නිමිත්තෙන් හකාස අණසක ආඥාපති මේජර් ජෙනරාල් ඩීකේජීඩී සිරිසේන යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් අතිඋත්කර්ෂවත් අන්දමින් වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබුණි. එහිදී ආඥාපති වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීම, සියලුනිල තේපැන් සංග්‍රහයක් පැවැත්වීම හා බොරළුගොඩ ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානයේ බෝධිපූජා පිංකම සංවත්සර වැඩසටහන් අතර විය.

## අභිමානවත් සැමරුමක මතක සටහන්...






4(සෙව්) ශ්‍රීලයුයුබ ඒකකයේ 13 වන සංවත්සරය 2020 ජනවාරි 09 දින ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ආමික වතාවත්වලට මුල්තැන දෙමින් පැවැත්විණ. එහිදී අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් පිරිනැමීම, සියලුනිල දිවාභෝජන සංග්‍රහයක් පැවැත්වීම සංවත්සර වැඩසටහන් අතර කැපී පෙනුනි.

## එකොළොස් වසක අභිමන් සැමරුම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකායට වසර 30 ක් සපිරීම නිමිත්තෙන් සංවත්සර සමරුම් වැඩසටහනක් 2020 ජනවාරි 15 දින වෛද්‍ය බළකා බළකාධිපති මෙන්ම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එස්එච් මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ දී පවත්වන ලදී. වෛද්‍ය බළකාධිපතිතුමන් වෙත කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන ආචාර පෙළපාලියක් පැවැත්වීම, රුක් රෝපණය, සියලු නිල තේ පැන් සංග්‍රහය යන වැඩසටහන් සංවත්සර දින වර්ණවත් කිරීමට මුල්විය. තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකා රෙජිමේන්තුවට අඩුපාඩුවක්ව පැවති අභිනවයෙන් ඉදිකරන ලද භට නිවාසය සහ ශ්‍රවණාගාර සහිත දෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම ද සංවත්සර දින සුවිශේෂී අවස්ථාවක් විය.





# "ආකල්ප සංවර්ධනය තුළින් යහපත් දිවියක්"....

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ "ආකල්ප වර්ධනය තුළින් අරුත්බර දිවියක්" උදෙසා වූ දේශන මාලාවක් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරේ.
ඒ යටතේ "යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීම තාරුණ්‍යය හා කාන්තා සෙබළිය, පුද්ගල සංවර්ධනය, නිරවුල් මානසිකත්වයෙන් සිය වෘත්තීයේ නියැලීම සහ ධනාත්මකව ජීවිතයකට මුහුණදීම" යන කරුණු පිළිබඳව හටපිරිස් තුළ ආකල්ප වර්ධනය කිරීම අපේක්‍ෂිතය.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රාජකාරී නියුතු ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති (ජාශිබ) විසින් එම දේශනය මෙහෙයවනු ලබයි.



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) හි පැවති දේශනයේදී





1 වන යුද්ධ හමුදා කාන්තා බළකායේ පැවති දේශනයේදී

# "යුද සාහිත්‍යය" දේශනයන්...

යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර යුද සාහිත්‍යය ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරන දේශන මාලාවේ තවත් අදියර තුනක් පසුගියදා 1 වන යුද්ධ හමුදා කාන්තා බළකාය, කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවේ හා සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

හටපිරිස් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති එම දේශන මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ යන නිලධාරී විසින් මෙහෙයවන ලදී.

තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට පනදුන් අභීත විරුවන්ගේ මතක හා අත්දැකීම් පිළිබඳ අලුත් පරපුර දැනුවත් කිරීමත්, එකී මෙහෙවරට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීමත් මෙම වැඩසටහනෙහි අරමුණයි.



කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරී පුහුණු දිනයේදී දේශනයේදී



සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සෙසුනිලයින් සඳහා පැවති දේශනයේදී

## විරු හිසට සෙවණක්...



යුද පිටියේදී තම ඒකකය වෙත අතිමහත් සේවයක් ඉටුකළ සතුරා සමඟ මුහුණට මුහුණ සටන් වැද 07 වරක් තුවාල ලැබූ 11 වන ගැමුණු හේවා බළඇණියට අයත් දක්‍ෂ පෙළ අණදෙන්නෙකු වූ සෙ/410651 කෝප්‍රල් රත්නායක කේකේඑස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී දැනට වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ලැබ මහනුවර, දිගන ප්‍රදේශයේ දිවි ගෙවයි.

ඔහුට ස්ථිර නිවසක් නොතිබීම හේතුවෙන් එවකට ඒකක අණදෙන නිලධාරී සහ දැනට ඉඩම් දේපල හට නිවාස අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂක බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු ගේ නිර්දේශය මත 14 සේනාංකයේ සේනාංකාධිපතිගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ ඉදිකරනු ලැබූ අංගසම්පූර්ණ නිවස එම සෙබළා වෙත 2020 ජනවාරි 17 දින භාරදෙන ලදී. 11 වන ගැමුණු හේවා බළඇණියේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකෙරුණු මෙම නිවසට නුගේගොඩ සෙවණ හෝල්ඩින්ස් අධිපති සුරාජ් සංජීවද සිල්වා මහත්මයා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

---

## 70 වසක් පුරා ආඩම්බර ගමනක්...





ඉංජිනේරු සේවා බළකායට වසර 70 ක් සපිරීම නිමිත්තෙන් සංවිධානයට කෙරුණු උත්කර්ශවත් සැමරුමක් 2020 ජනවාරි 10 හා 11 යන දෙදින තුළ ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානය - පනාගොඩ හිදී පවත්වන ලදී. එහිදී ඉංජිනේරු සේවා බළකා කර්නල් සේනාවිධායක හා ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ බ්‍රිගේඩියර් ආර් ගනේගොඩ පීඑස්සී වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, ඉංජිනේරු සේවා බළකා ස්මාරකය අභියසදී මියගිය රණවිරුවන් සිහිපත් කිරීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, ක්‍රීඩා තරඟ හා  සංගීත ප්‍රසංගය සංවත්සර දින වැඩසටහන් අතර කැපීපෙණුනි.

## 6 වන සංවත්සරය අභිමානවත්ව සමරයි...

ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් පාලනය වන 121 බළසේනාවේ 6 වන සංවත්සරය බළසේනාධිපති බ්‍රිගේඩියර් එන්සී සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් එහි රාජකාරී නියුතු සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් 2020 ජනවාරි 09 දින සමරන ලදී. එහිදී බළසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රුක් රෝපණය, සියලු නිල දිවා භෝජන සංග්‍රහය සංවත්සර වැඩසටහන් අතරට එක්වූ අංග විය.





## මී මැසි පාලනය පිළිබඳ දේශනයක්...





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) වෙතින් පාලනය වන 11 සේනාංකය වෙතින් බදාදා දින පුහුණුවීම් දිනයට සමගාමීව 11 සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒඑස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මගපෙන්වීම මත බිඟු සම්පත සුරැකීමේ සංවිධානයේ ගරු ලේකම් තිස්ස බණ්ඩාර මහතා විසින් මීමැසි පාලනය පිළිබඳ හරවත් දේශනයක් පසුගිය ජනවාරි 22 දින සේනංක දේශන ශාලාවේදී පවත්වන ලදී. මෙම දේශනය සඳහා නිලධාරීන් 10 දෙනෙකු සහ සෙසුනිලයින් 100 ක් සහභාගි වූහ.

## කඳවුරු සංචාරයක නිරත වෙමින්...





14 සේනාංක මූලස්ථානයේ නව සේනාංකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් ඒඑස් ආරිසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ වැඩ භාරගැනීමෙන් පසු සේනාංකයට අයත් 141 බළසේනාව සහ එම බළප්‍රදේශයේ ස්ථානගත 8 ශ්‍රී ලංකා පාබල හමුදාව සහ 5 විජයබා පාබල රෙජිමේන්තුවේ සංචාරයක නිරත වීම පසුගිය ජනවාරි 13 සහ 14 යන දෙදින සිදුවිය. මෙම සංචාරයේදී ඒකකයන් වෙතින් ආරක්ෂාව ලබාදෙනු ලබන මරමස්ථාන ඇතුළු සියලුම ස්ථානයන්හි සංචාරය කළ අතර, එහිදී ආරක්ෂක කටයුතු මෙන්ම සෙබලුන්ගේ සුභසාධන කටයුතු සහ සනීපාරක්ෂක කටයුතු සබැඳිව සේනාකාධිපති විසින් නිරීක්ෂණය කරන ලදී.

## සුහදත්වය වර්ධනයට කැරම් තරඟාවලියක්....

යාපනය ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් පරිදි 55 සේනාංකය විසින් සංවිධානය කළ කැරම් තරඟාවලියක් පසුගිය පෙබරවාරි 03 දින 55 සේනාංක බළඇණි පුහුණු පාසලේදී පැවැත්විණ. එහිදී සේනාංකය යටතේ පිහිටි බළසේනා මූලස්ථාන සහ ඒකකයන් වෙතින් නියෝජනය කළ කැරම් කණ්ඩායම් අතුරින් 553 බළසේනා මූලස්ථානය එහි ශූරතාවය හිමිකරගන්නා ලදී.





## බිත්තර...

**පුතා** - ඇයි අම්මෙ කඩෙන් බිත්තර ගේද්දි කවරෙට පිදුරු දාල දෙන්නෙ...

**අම්මා** - ඒ උඹට කන්ඩ...



## බෙල් එක...

**සඳුනි** - හලෝ... මේ වයරින් වැඩ කරන බාස්ද කතා කරන්නේ?

**වයරින් බාස්** - ඔව්.. මම තමයි මිස්...

**සඳුනි** - මම දැන් දවස් කීයක ඉඳන් කියනවද අපේ ගෙදර වැඩක් තියෙනව එන්ඩ කියල...

**වයරින් බාස්** - මම දවස් දෙක තුනක්ම ඇවිත් බෙල් එක ගැහුව මිස්... කවුරුත් එලියට ආවෙ නෑනෙ...

**සඳුනි** - අපේ ගෙදර බෙල් එක තමයි අනේ කැඩිල තියෙන්නෙ...

## උපන් දින තෑග්ග...

**කසුන්** - මචං... ආච්චිගෙ උපන්දිනේට උඹ මොනවද තෑගි දෙන්නෙ?

**සමීර** - ක්‍රිකට් බැට් එකක් බං...

**කසුන්** - ඈ බං... ආච්චි ක්‍රිකට් ගහන්නෙ නෑනෙ....

**සමීර** - මගෙ උපන් දිනේට ආච්චි දුන්නෙ බණ පොතක්...



## කසාද බැඳීම...

**පුතා** - තාත්තේ... ඇයි අපිට කෙල්ලො දෙතුන් දෙනෙක් බඳින්න නීතියෙන් අවසර දීල නැත්තෙ...

**තාත්ත** - උඹ එක කෙල්ලෙක් බැඳගෙන බලපන්... ඊට පස්සෙ තේරෙයි නීතිය අරන් තියෙන්නෙ අපේ පැත්ත කියල...



## දත් ගැලවීම...

**චමත්** - මොක යකෝ දත් කැක්කුමට බෙහෙත් ගේන්න ගිහිං මෙච්චර පරක්කු උනේ...

**නිමල්** - අනේ බං මට මාර වැඩේනෙ උනේ...

**චමත්** - ඇයි මොකද උඹට උනේ...

**නිමල්** - *Open* කියල ගහල තිබුණ නිසා ඇතුළට ගිහින් බෙහෙත් අරන් හැරිල බලද්දි දොරේ *Close* කියල ගහල තියෙනව කියල ඉතින් ෆාමසිය අරිනකල් ඉන්න උනා එන්න...





# රෙජිමේන්තු ඉතිහාසය



වත්මන් කර්නල් සේනාවිධායක
බ්‍රිගේඩියර් බී පී කල්දේරා

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය යුද සමයේදී මෙන්ම වෙනත් කාල වකවානුවලදීද උදාර සේවයක් කොට මහත් කිර්තියක් අත්කර ගන්නා ලද ලද, රාජකීය යුද්ධ හමුදා සැපයීම් හා ප්‍රවාහන බළකායක් ලෙස ගැනේ. මුලින්ම සැපයීම් හා ප්‍රවාහන කටයුතු කරනු ලබන බළකායක් බිහි වුයේ 1918 අප්‍රේල් 12 වන දිනය. එවකට පිහිටවූ සැපයීම් හා ප්‍රවාහන බළකායේ ප්‍රධාන කාර්ය වූයේ සේනාවට සැපයීම් හා ප්‍රවාහන කාර්‍යයන් පුහුණු කරවීම, සරඹ හා දේශන පවත්වා කාර්‍යක්ෂම වූ සේවා බළකා සෙබළුන් බිහි කරවීමයි.

1918 පළමුවන ලෝක සංග්‍රාමය අවසන් වූ පසු ඉතා උද්යෝගිමත් සෙබළුන් මෙම බළකායට ඇතුළු වූ නිසා බළකාය ඉතා දියුණු තත්වයකට පත්වූයේය. සැපයීම් හා ප්‍රවාහන බළකායේ මෙම දියුණු තත්වය නිසාම රාජකීය හමුදා සේවා බළකාය පදනම මතම නව සැකැස්මක් අනුව බිහිවුනි. 1927 වකවානුව වන විට බළකායේ කටයුතු කිරීමට අවශ්‍ය රථ, කුලිය ගෙවීමේ පදනම මත යෙදවන ලදී.

මෙම බළකායේ සියළුම කාර්යයන් රාජකීය යුද්ධ හමුදා සේවා බළකායේ කාර්යයන් පදනම් කොට සැකසී 1930 මාර්තු 21 වන දින පස්වන ජෝර්ජ් අධිරාජ්‍යයාගේ අනුමැතිය ඇතිව සැපයීම් හා ප්‍රවාහන බළකාය හා රාජකීය යුද්ධ හමුදා සේවා බළකායන් අතර, කිට්ටු සම්බන්ධතාවයක් ඇති කරන ලදී. 1932 නොවැම්බර් මස 03 වන දින පස්වන ජෝර්ජ් අධිරාජයාගේ අනුමැතිය ඇතිව කෙනට් හි ආධිපාද තුමා මෙම බළකායේ ගෞරවණීය කර්නල් තනතුර භාර ගැනීමෙන් මෙම සබඳකම් තවදුරටත් වැඩිදියුණු විය. ඒ අනුව 1933 සැප්තැම්බර් මස 17 වන දින සැපයීම් හා ප්‍රවාහන බළකාය වෙනුවට යුද්ධ හමුදා සේවා බළකාය යනුවෙන් නම් කෙරුණි. 1938 ඔක්තෝබර් මස සිට ශ්‍රීලයුසේබ බළකායට නැවත සංවිධානය කරන ලද පළමුවන වරට ලාංකිකයන් බඳවා ගැනීම ආරම්භ කෙරුණි.

මුළු බළකායේ එවකට නිලධාරීන් 18 කින් හා සෙසු නිලයින් 150 කින් සමන්විත වූවද පසුකාලීනව වගකීම් කාර්යයභාරය වැඩි වූ හෙයින් 1945 අගෝස්තු මස වන විට ඒකකයේ නිලධාරීන් සංඛ්‍යාව 63 ක් ලෙස හා සෙසු නිලයින් සංඛ්‍යාව 2369 ලෙස වැඩිවූහ. මෙම අවධියේ බහුතර සංඛ්‍යාවක් ලාංකිකයන් අධිකාරියට පත් කරන ලදී.

සේවා බළකායේ ඉතිහාසය රන් අකුරින් ලියවෙන සිද්ධියක් වුයේ නිත්‍ය සෙබළුන්ගෙන් සැදුම්ලත් ලංකා යුද්ධ හමුදා සේවා බළකායක් නිත්‍ය හමුදාවක් ලෙස 1948 පෙබරවාරි මස 04 වන දින නිදහස ලැබීමත් සමග බිහිවීමයි. මෙම බළකාය ලංකා ආරක්ෂක සේවාවන්ගෙන් හා රාජකීය යුද්ධ හමුදා සේවා බළකායේ සේවය කළ අයගෙන් හා ලංකා යුද්ධ හමුදා සේවා බළකායේ සේවය කළ අයගෙන් සමන්විත වු අතර, 1949 ඔක්තොබර් 31 වන දින ස්වේච්ඡා ශ්‍රීලයුසේබ නිලධාරියෙකු වු කපිතන් ඩබ්ලිව් ඩබ්ලිව් පෙරේරා යන නිලධාරියාගේ අණදීම යටතේ එක් සෙනීන් කණ්ඩායමකින් සමන්විත ලංකා යුද්ධ හමුදා නිත්‍ය සේවා බළකාය පිහිටුවන ලද අතර, පසුව 1972 මැයි මස 22 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ලෙස හැඳින්වීමට පටන් ගැණිනි.

වර්තමානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය නිත්‍ය ඒකක 07 කින් හා ස්වේච්ඡා ඒකක 02 කින් සමන්විත වේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය අමු සලාක හා වියලි සලාක ද්‍රව්‍ය සැපයීම් හා ප්‍රවාහන, ඉන්ධන, ලිහිසි තෙල් ද්‍රව්‍ය සැපයීම් හා ලිපිකරු, ගබඩාකරු, රියදුරු, සූපසහයක හා දැවකැම් රාජකාරී සඳහා යුද්ධ හමුදාව වෙත තම දායකත්වය දැක්වීම සිදුකරන අතරම එම වෘත්තීන්වල පාඨමාලා පැවැත්වීමේ කාර්යයද ඉටුකරනු ලබයි.

ඉදිරිපත් කිරීම
රෙජිමේන්තු මධ්‍යස්ථාන
ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය

VISION

# English

VISION SPECTRUM

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රිසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Let

යම්කිසි ක්‍රියාවක් සිදුකිරීමට යමෙකුට "තරමක්" යන අර්ථය ඇතිව භාවිතා කරන උපකාරක ක්‍රියා පදයක් ලෙස වාක්‍ය කණ්ඩ නිර්මාණය කිරීමේදී බහුලව භාවිතා වේ.

***Fomular -*** සූත්‍රය

**Let + Objective Pronoun + Verb (Infinitive) + Object + Rest.**
ලෙට් + ඔබ්ජෙක්ට් ප්‍රෝනවුන් + වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
ඉඩ දෙන්න + කර්ම කාරක සර්වනාම පද + ක්‍රියා පදයේ මූලික ස්වරූපය + ඉතිරිය.

***Ex /*** උදා :-

1. Let me go out.
   ලෙට් මී ගෝ අවුට්.
   මට එළියට යන්න ඉඩ දෙන්න.
2. Let them speak.
   ලෙට් දෙම් ස්පීක්.
   ඔවුන්ට කතා කරන්න ඉඩ දෙන්න.
3. Let him sing a song.
   ලෙට් හිම් සිංග් අ සෝන්ග්.
   ඔහුට සිංදුවක් කියන්න ඉඩ දෙන්න.
4. Let Kasun play.
   ලෙට් කසුන් ප්ලේ.
   කසුන්ට සෙල්ලම් කරන්න ඉඩ දෙන්න.

***Nota Bene /*** සැ.යු :-

***Let*** යන පදය ආකාර කිපයකට භාවිතයේ යෙදෙනු දැකිය හැකිය. එහිදී යම් අයෙකුට යම්කිසි කාර්‍යයක් කිරීමට ආරාධනා කිරීමේදී හෝ ඉල්ලීමක් කිරීමේදී ඉතා සරළව භාවිතා කළහැකි පෙර ඇදී ක්‍රියා පදයක් ලෙසද භාවිතා කළ හැක.

***Ex /*** උදා :-

1. Let us go = Let's move.
   ලෙට් අස් ගෝ.
   අපි යමු.
2. Let us speak = Let's speak.
   ලෙස් අස් ස්පීක්.
   අපි කතා කරමු.

ඉහත පෙන්වා දී ඇති ආකාරයට අනුව යම් ආරාධනාවක් කිරීමේදී හෝ ඉල්ලීමක් කිරීමේදී ***us*** - අපි යන අර්ථය සමඟ ***Let*** යන පදය සංයෝගවී ***Let's*** වශයෙන් භාවිතාවීම පමණක් වාක්‍යවල දැකිය හැකිය. එහිදී ***Let's*** යන පදයේ අර්ථය අපි කරමු ලෙස පිළිඹිබු වේ.

**Let:** ඉඩ දෙන්න ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කාණ්ඩය වාක්‍යයේ භාවිතා වේ.

**Objective Pronoun:** කර්ම කාරක සර්වනාම පද වශයෙන් පහත පෙන්වාදී ඇති පද භාවිතා වේ. **me -** මට, **us -** අපට, **them -** ඔවුන්ට, **her -** ඇයට, **him -** ඔහුට, **it -** ඒයට. තවද නිදසුන්හි පෙන්වාදී ඇති පරිදි මෙහිදී පුද්ගලයෙකුගේ නමක් වුවද භාවිතා කළ හැක.

**Verb:** ක්‍රියා පදයේ වාක්‍යයේ භාවිතා කිරීමේදී ක්‍රියා මූල **infinitive** පදයක් ලෙස භාවිතා කළ යුතුය.

***Rest :-*** ඉතිරි වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

Analysis of the sentence formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.

Let + Object Pronoun+ Verb(infinitive) + Object + Rest.
ලෙට් + ඔබ්ජෙක්ට් ප්‍රෝනවුන් + වර්බ් (ඉන්ෆනිටිව්) + ඔබ්ජෙකට් + රෙස්ට්.
ඉඩ දෙන්න + කර්ම කාරක සර්වනාම පද + ක්‍රියා පදයේ ස්වරූපය + ඉතිරිය.

Let me go out.
ලෙට් මී ගෝ අවුට්.
මට එළියට යන්න ඉඩ දෙන්න.

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk





ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයේ ප්‍රධාන සංඥා නිලධාරී ලෙස

**මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීජීකේ තිලකරත්න පීඑස්සී**

2020 පෙබරවාරි මස 27 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



හකාස අණසක මූලස්ථානයේ ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් අයිඕඩබ්ලිව් මාදොල**

2020 පෙබරවාරි මස 05 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් එල්පීආර් ප්‍රේමලාල් යූඑස්පී**

2020 පෙබරවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 ජනවාරි මස 07 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) බ්‍රිගේඩියර් (පාලන/හකාස) ලෙස

**බ්‍රිගේඩියර් ඩීපී හතුරුසිංහ යූඑස්පී**

2020 ජනවාරි මස 20 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



සන්නද්ධ බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් එම්පීටීඩී රත්නසේකර යූඑස්පී**

2019 දෙසැම්බර් මස 27 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමානි ලෙස

**බ්‍රිගේඩියර් එම්එල්කේ සමරසිංහ අයිජී**

2020 පෙබරවාරි මස 03 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



65 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2020 ජනවාරි මස 18 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



54 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ඩීඑස්ඩී වැලිකල ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති ලෙස

**බ්‍රිගේඩියර් බීබී රන්දෙණිය**

2020 පෙබරවාරි මස 01 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ප්‍රමානි 1 (සම්බන්ධීකරණ) ලෙස

**ලුතිතන් කර්නල් යූඩබ්ලිව්එම්ටී කරුණාරත්න**

2020 ජනවාරි මස 16 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ප්‍රමානි 1 (සම්බන්ධීකරණ) ලෙස

**ලුතිතන් කර්නල් ඩීඑම්බීපීබී දිසානායක ආර්එස්පී යූඑස්පී**

2020 ජනවාරි මස 28 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා
මූලස්ථානය (යාපනය)
ප්‍රමාණි 1 (ක්‍රියා) ලෙස

**ලුතිනන් කර්නල්
ඒඑම්ඩීබී අධිකාරි
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
පීඑස්සී**

2020 ජනවාරි මස 15 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



4(සෙව්)ශ්‍රී ලංකා යුද්ධ හමුදා
යුධොපකරණ බළකායේ
අණදෙන නිලධාරීලෙස

**මේජර්
ඩබ්ලිව්එම්එස්එම්බී
වන්සේකර ඒඒටීඕ**

2020 ජනවාරි මස 01 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පොලිස් හේවා බළකායේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්
ආර්එම්එන් රත්නායක
යූඑස්පී එල්එස්සී**

2019 අගෝස්තු මස 15 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ජ්‍යෙෂ්ඨ ආරක්ෂක
සම්බන්ධීකරණ කාර්යාලයේ
නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ ආරක්ෂක
සම්බන්ධීකරණ නිලධාරී
ලෙස

**මේජර්
පීඑම්අයිඑම් පතිරාජ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 ජනවාරි මස 27 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු

---



තුන්වන වියට පා තබන

**වයි.කේ. හිනුල රන්සල පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/652593 කෝප්‍රල් චතුරංග
වයිකේසී)



පළමු වියට පා තබන

**කෙනුල නතේෂ් කරුණාතිලක
පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/5ඩී03273 සාසෙ
කරුණාතිලක ඩබ්ලිව්ජීසීකේ)



හයවන වියට පා තබන

**පී.ඒ. මෙතුෂි යොහන්සා
දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/16එච්00342 ලා/කෝ
ජයතිස්ස පීජ්එන්)



තෙවන වියට පා තබන

**බී.කේ. නිපුනි සත්සරණි
බාලසූරිය දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/22එෆ්0379 සාසෙ චමින්ද
කුමාර)



සිව්වන වියට පා තබන

**සෙනුල මිශාදිත් දසනායක
පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(කපිතන් ඩීඑම්සීඑම්
දසනායක)



පළමු වියට පා තබන

**යුමෙත් දල්සර පනාගොඩ
පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/365820 සැරයන් ප්‍රසන්න
පීඑස්)



දෙවන වියට පා තබන

**ඒ.එම්. ඉතිකෂා අභිමානි
අබේසිංහ දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(සෙ/109474 කෝප්‍රල්
අබේසිංහ ඒඑම්එන්සී)



තෙවන වියට පා තබන


**විදස් ලින්දුල මොරගොඩ
දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි
පතන්නේ අම්මා හා තාත්තා
ඇතුලු පවුලේ සැම
(මේජර් පීයූ සුරේෂ් ප්‍රේමසිරි)


# සිත්තම් අඳින විස්කම් දෑතක්...



3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවට අයත් සෙ/කිසු111593 ලා/කෝ වීරසේකර ඩබ්ලිව්එස්පී සහජයෙන්ම සිතුවම්කරණයට දක්ෂයෙකි. ඔහුගේ නිර්මාණ හා විවිධ මාධ්‍යය භාවිතාකර අඳිනු ලබන අතර, මිනිරන් පැන්සල්, පාට පැන්සල්, දියසායම් එසේ භාවිතා කරන මාධ්‍ය වේ. එසේම නව අත්හදාබැලීම් ලෙස සුදු ඇඳුම් සඳහා යොදන නිල් සහ කෝපි කහට භාවිතයෙන්ද ඔහු තම සිතුවම් නිර්මාණය කරනු ලබයි. මෙහි දැක්වෙන්නේ විවිධ මාධ්‍ය භාවිතයෙන් ඔහු විසින් නිර්මාණය කරන ලද එවැනි සිතුවම් කිහිපයකි. මෙවර රණවිරුවාහි ඔහු වෙනුවෙන් ඉඩ වෙන් කෙරෙනුයේ ඔහුගේ හැකියාවන් සමාජගත කරමින් ඔහුට දිරියක් ලබාදීම පිණිසය.




කෝපි කහට යොදාගනිමින් අඳින ලද සිතුවම



දියසායම් යොදාගනිමින් අඳින ලද සිතුවම



නිල් මාධ්‍ය යොදාගනිමින් අඳින ලද සිතුවම



පාට පැන්සල් යොදාගනිමින් අඳින ලද සිතුවම



මිනිරන් පැන්සල් යොදාගනිමින් අඳින ලද සිතුවම



මිනිරන් පැන්සල් යොදාගනිමින් අඳින ලද සිතුවම


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ

සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජ්එම් - 11 ඉසේරෙ

සෙ/2081045 ඉසෙ ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය






**අධීක්‍ෂණය**

මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**

කපිතන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**

කපිතන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ

# සිරසෙන් සිරසට සෙවණක්...



කඩවත ප්‍රදේශයේ නුගේගොඩ, මහර පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් වෙනුවෙන් "සිරසට 25 යි - ගෙවල් 25 යි" එම්ටීවී මාධ්‍යය ජාලයේ සුබසාධන ව්‍යාපෘතිය යටතේ ඉදිකළ 8 වන නිවස නිවාසලාභියා වෙත පැවරීමේ උත්සවය පසුගිය පෙබරවාරි 25 දින පැවැත්විණ. එම අවස්ථාවට වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සමගින් එම්බීසී හා එම්ටීවී මාධ්‍ය ජාලයේ සහය අධ්‍යක්ෂ නීඩ්රා වීරසිංහ මෙනවිය, එම්බීසී මාධ්‍ය ජාලයේ ප්‍රධාන විධායක නිලධාරී නියෝමී නලවංස මෙනවිය, එම්ටීවී මාධ්‍ය ජාලයේ මානව සම්බන්ධතා අධ්‍යක්ෂ ප්‍රියන්ත විජේසිංහ සහ එම්ටීවී මාධ්‍ය ජාලයේ ප්‍රධාන විධායක නිලධාරී සුසාර දිනාල් යන මහත්වරුද සහභාගි වූහ.




යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ගනේමුල්ල පිහිටි කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථානයේ සේවයේ නියුතු සාමාජිකයින්ගේ ඉංජිනේරු සහ තාක්ෂණික දැනුම යොදා ගනිමින් ඉදිකරන ලද මෙම නිවසට අවශ්‍ය අමුද්‍රව්‍ය සිරස රූපවාහිනී නාලිකාවේ සංවිධායකයින් විසින් සම්පාදනය කර තිබුණි.





# අවධානමට සූදානම් වෙමු...

## කොරෝනාවට එරෙහි මෙහෙයුම ඇරඹේ...





ලොව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් ඇති කොරෝනා වෛරසයෙන් ශ්‍රී ලංකාවාසී ජනතාව බේරා ගැනීම වෙනුවෙන් අරඹා ඇති දැවැන්ත ක්‍රියාවලියෙහි පුරෝගාමී මෙහෙවරක නියැලෙනුයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවයි. වෛරසය පාලනයට හා එය මෙරට ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රජය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පොලීසියේ සහයෝගය ඇතිව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇත්තේ ලෝකයේ සෙසු රටවලට වඩා බොහෝ ඉදිරියෙනි.

කොරෝනා වෛරසය අවි බලයෙන් හෝ වෙනත් සංග්‍රාමික ක්‍රමෝපායන් මගින් විනාශ කළ නොහැකි මුත්, යුද්ධ හමුදාවේ සාමූහික ශක්තිය, විනය හා කැපවීම තුළින් මෙම උවදුර මැඩලීමේ හැකියාව නිසැකවම පවතී. එන්න, අපි එකතුව මේ ව්‍යසනයෙන් ගොඩඒමු.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.